# 2018

# කාර්යසාධන වාර්තාව

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව

**මහා භාණ්ඩාගාරය**

**මුදල් අමාත්‍යාංශය**

කොළඹ - 01

# පටුන


**1 හැඳින්වීම ........................................................................................................ 1**

1.1 සංවිධාන රාමුව ........................................................................................................ 1

1.2 දැක්ම ........................................................................................................ 1

1.3 මෙහෙවර ........................................................................................................ 1

1.4 අරමුණු ........................................................................................................ 1

1.5 අභිමතාර්ථ ........................................................................................................ 2

1.6 සංවිධාන සටහන ........................................................................................................ 3

1.7 වෙළඳ අංශය ........................................................................................................ 4

1.7.1 වෙළඳ ප්‍රතිපත්ති කාර්යයන් ........................................................................ 4

1.7.1.1 වෙළඳ ප්‍රතිපත්ති ........................................................................ 4

1.7.1.2 තීරු බදු ප්‍රතිපත්ති ........................................................................ 4

1.7.1.3 නිදහස් වෙළඳ ගිවිසුම් ........................................................................ 5

1.7.2 විශේෂ ව්‍යාපෘති ........................................................................................................ 5

1.8 පරිපාලන හා මූල්‍ය අංශය ........................................................................................................ 5

**2 වෙළඳ අංශයේ කාර්ය සාධනය ........................................................................................................ 6**

2.1 වෙළඳ ප්‍රතිපත්තිය ........................................................................................................ 6

2.2 වෙළඳ ගිවිසුම් ........................................................................................................ 7

2.2.1 වෙළඳ ගිවිසුම්වල ප්‍රගතිය ........................................................................ 8

2.2.1.1 ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) .................................. 8

2.2.1.2 පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) ....................... 9

2.2.1.3 දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) ............................. 9

2.2.1.4 ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) ........................................ 11

2.2.1.5 ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම .................................... 12

2.2.1.6 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගිතාව සඳහා වූ බහු ආංශික ගිවිසුම (BIMSTEC) ....................................... 12

2.2.1.7 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම .................... 13

2.2.1.8 යෝජිත චීන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම ........................................ 14

2.2.1.9 යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම.......................... 14

2.2.1.10 යෝජිත බංග්ලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ....................... 15

2.2.2 නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ අන්තර් ජාතික වෙළඳාම ............................................ 16

2.3 වෙළඳාම් පහසුකරණය ........................................................................................................ 16

2.4 ආනයන තීරුබදු ව්‍යුහය ........................................................................................................ 20

2.4.1 2018 වසරේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට අළුතින් එනතු කරන ලද ජාතික උප බෙදීම් ........................................ 21

2.4.2 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ සිදුකරන ලද සංශෝධනයන් 23

2.4.3 2007 අංක 48 දරණ වෙළඳ භාණ්ඩ බදු පනත ........................................ 27

2.5 බන්ධිත ගුදම් ........................................ 32

2.6 ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ කරුණු ........................................ 32

2.7 රේගු නඩු ........................................ 38

2.8 අධිකරණ නඩු ........................................ 38

2.9 විශේෂ ව්‍යාපෘති අංශය ........................................ 38

2.9.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය ........................................ 38

2.9.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ බලපත්‍ර ලබා දීම ........................................ 38

2.9.3 රාජ්‍ය තාන්ත්‍රික නිලධාරින් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ සහනදායී කොන්දේසි මත මෝටර් රථ ආනයන කිරීමේ යෝජනා ක්‍රමය ........................................ 39

2.9.4 විවිධ බදු සහන යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම 39

2.9.5 බදු නිදහස් කිරීම් ........................................ 39

2.9.6 අපනයන සැකසුම් යෝජනා ක්‍රමය සඳහා ආනයනය........................................ 42

2.10 වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම ........................................ 42

2.11 සාර්ක් සංවර්ධන අරමුදල ........................................ 43

**3 පරිපාලන හා මූල්‍ය අංශයේ කාර්යසාධනය ........................................ 45**

3.1 පරිපාලන අංශය ........................................ 45

3.2 මූල්‍ය අංශය ........................................ 51

3.3 විගණන විමසුම්........................................ 52


.

# වගු


| | | | |
|---|---|---|---|
| වගුව | 2.1 | ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2017 / 2018 | 08 |
| වගුව | 2.2 | පකිස්තාන් ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2017 / 2018 | 09 |
| වගුව | 2.3 | දකුණු ආසියානු වෙළඳ ගිවිසුම යටතේ එක් එක් සාමාජික රට විසින් II අදියර යටතේ පවත්වාගෙන යන සංවේදි ලැයිස්තුව සහ III අදියර යටතේ අඩු කිරීමට එකඟ වූ ප්‍රතිශතය | 10 |
| වගුව | 2.4 | දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2017 / 2018 | 11 |
| වගුව | 2.5 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම - 2017 / 2018 | 11 |
| වගුව | 2.6 | 2018 වර්ෂය තුල වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ ආනයන/අපනයන පිළිබඳ තොරතුරු | 16 |
| වගුව | 2.7 | 2018 දෙසැම්බර් 31 වැනි දිනට තීරු බදු ව්‍යුහය | 20 |
| වගුව | 2.8 | 2011 සිට 2018 දක්වා තීරු බදු ව්‍යුහයේ වෙනස්කම් | 21 |
| වගුව | 2.9 | 2018 වර්ෂයේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට ඇතුළත් කරන ලද නව ජාතික උප බෙදීම් | 22 |
| වගුව | 2.10 | 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත (රේගු ආනයන බදු වෙනස්වීම්) | 24 |
| වගුව | 2.11 | 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ සිදුකරන ලද බදු සංශෝධන | 27 |
| වගුව | 2.12 | විදේශ විනිමය පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් ලබා දුන් අනුමැතිය | 33 |
| වගුව | 2.13 | රේගු අඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ 2018 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම් | 39 |
| වගුව | 2.14 | රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ තීරු බදු කපා හැරීම් | 40 |
| වගුව | 3.1 | 2018.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය | 45 |
| වගුව | 3.2 | 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ නිලධාරීන් | 46 |
| වගුව | 3.3 | 2018 වසරේදී දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරීන් | 46 |
| වගුව | 3.4 | 2018 වසරේදී පුහුණු පාඨමාලා/අධ්‍යයන චාරිකා/විදේශ සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූ නිලධාරීන් | 47 |
| වගුව | 3.5 | 2018 වසරේදී දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යයන චාරිකා/සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූ නිලධාරීන් | 48 |
| වගුව | 3.6 | 2018 වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු උපයෝජනය | 51 |
| වගුව | 3.7 | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2018 | 51 |

# 1. හැඳින්වීම

## 1.1 සංවිධාන රාමුව

ශ්‍රී ලංකා ආර්ථිකයේ සහ ජනතාවගේ යහසාධනය උදෙසා විදේශ වෙළඳාම, තීරුබදු සහ ආයෝජන සම්බන්ධයෙන් තිරසාර ප්‍රතිපත්ති සම්පාදනය සහ ක්‍රියාත්මක කිරීම මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරය වේ. 2006 වර්ෂයේ ජුනි මාසයේදී මෙම දෙපාර්තමේන්තුව වෙළඳ, තීරුබදු හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වශයෙන් මුදල් අමාත්‍යාංශයේ මහා භාණ්ඩාගාරය යටතේ නම් කරන ලද්දේ රටේ ආර්ථිකය ජාත්‍යන්තරය හා ඒකාබද්ධ කිරීම ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා පහසුකම් සැපයීමේ පුළුල් පරමාර්ථයෙනි. දෙපාර්තමේන්තුවේ කාර්යයන් වඩාත් පුළුල් කිරීම සඳහා "වෙළඳ සහ ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව" වශයෙන් 2012 වර්ෂයේදී නැවතත් මෙහි නම වෙනස් කරන ලදී.

වර්ෂ 2018 දී වඩා ඵලදායි සේවාවක් ලබා දීම උදෙසා දෙපාර්තමේන්තුවේ උපායමාර්ගික දිශානතිය ප්‍රතිව්‍යුහගත කර එහි දැක්ම, මෙහෙවර, අරමුණු හා අභිමතාර්ථ මෙන්ම ආයතනික ව්‍යුහයද විධිමත්ව සකස් කරන ලදි. දෙපාර්තමේන්තුව විසින් ස්වකීය ප්‍රධාන කාර්යයන් ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් පරිදි අංශ දෙකක් ස්ථාපනය කරන ලදි.

I. වෙළඳ අංශය
II. පරිපාලන හා මූල්‍ය අංශය

## 1.2 දැක්ම

රටේ සමස්ථ සංවර්ධනය උදෙසා වෙළඳාම හා ආයෝජනය තුළ ප්‍රගතිගාමී ප්‍රතිපත්ති සුරක්ෂිත කිරීම.

## 1.3 මෙහෙවර

සමස්ථ සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර ආර්ථික වෙළඳ පද්ධතියට පහසුකම් සැලසීම සඳහා වෙළඳ හා ආයෝජනයට හිතකර පරිසරයක් නිර්මාණය කිරීම.


## 1.4 අරමුණු

- කර්මාන්ත හිතකාමී තීරු බදු ක්‍රමවේදයක් ඇති කිරිම
- ව්‍යාපාර පහසු කිරීම් දර්ශකය අනුව ශ්‍රී ලංකාව පලමු රටවල් 50 අතරට ගෙන ඒම
- තරඟකාරී වාසි ලැබෙන පරිදි වෙළඳ ගිවිසුම් ක්‍රියාත්මක කිරීම
- රජයේ ආර්ථික හා සමාජීය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා බදු සම්මුතීන් ක්‍රියාත්මක කිරීම
- දකුණු ආසියානු කලාපය තුළ ඍජු විදේශ ආයෝජන සඳහා කේන්ද්‍රස්ථානය ලෙස ශ්‍රී ලංකාව ප්‍රවර්ධනය කිරීම

## 1.5 අභිමතාර්ථ

- ආයෝජන අධෛර්යට පත් කළ සීමා ඉවත් කිරීම.
- අපනයන සැකසුම් යෝජනා ක්‍රම සඳහා තාවකාලික ආනයනය කිරීම් හා බන්ධිත ගුදම් ප්‍රතිපත්ති ශක්තිමත් කිරීම
- සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය අංශය සඳහා ප්‍රතිපත්ති සකස් කිරීම සඳහා අදාළ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා සංවිධානය කිරීම
- සේවාදායකටන්ට හිතකරවූ දත්ත පද්ධතියක් මඟින් අවශ්‍ය තොරතුරු සපයමින් ව්‍යවසායකයින්ට සහයෝගය දැක්වීම
- රාජ්‍ය නිලධාරීන්හට සහනදායී වාහන බලපත්‍ර නිකුත් කිරීම විධිමත් කිරීම
- රටේ වෙළඳ ආර්ථිකයේ අසමමිතික ස්වභාවය තුළ අන්‍යෝන්‍ය ප්‍රතිලාභ පදනම් කරගෙන නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම
- ගෝලීය වාසිසහගත වෙළඳාම/කර්මාන්ත වලට ප්‍රවේශවීමට ඉඩ සලසන්නාවූ නිදහස් වෙළඳ ගිවිසුම් ප්‍රවර්ධනය කිරීම

## 1.6 සංවිධාන සටහන




ස.අ. : සහකාර අධ්‍යක්ෂ
ප.නි. : පරිපාලන නිලධාරී
තො.තා.නි. : තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී
සං.නි. . : සංවර්ධන නිලධාරී
ප්‍ර.රා.ක.ස. : ප්‍රධාන රාජ්‍ය කළමනාකරණ සහකාර
රා.ක.ස. : රාජ්‍ය කළමනාකරණ සහකාර
කා.කා.ස. : කාර්යාල කාර්ය සහායක

## 1.7. වෙළඳ අංශය

### 1.7.1. වෙළඳ ප්‍රතිපත්ති කාර්යයන්

වෙළඳාම, කර්මාන්ත සහ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අදාළව වෙළඳ හා තීරුබදු ප්‍රතිපත්ති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ සංශෝධනය කිරීම පිළිබඳව වගකීම වෙළඳ ප්‍රතිපත්ති අංශය සතු වේ. එමෙන්ම, අභියාචනා සහ රෙගුලාසි ඇතුළත් රේගු පරිපාලන කටයුතු සම්බන්ධීකරණය ද මෙම අංශය යටතේ සිදු කෙරේ. තවද , මෙම අංශය මඟින් සහනදායී යෝජනා ක්‍රම යටතේ මෝටර් රථ ආනයනය කිරීමට අදාල කටයුතු සහ විවිධ බදු සහන යටතේ ගෙන්වන ලද වාහන අපහරණය කිරීමට අදාළ කටයුතු  සිදු කෙරේ. වෙළඳ අංශය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇති පරිදි වේ.

#### 1.7.1.1. වෙළඳ ප්‍රතිපත්තිය

i. ව්‍යාපෘති පදනම යටතේ මෝටර් රථ ආනයන ප්‍රතිපත්ති සකස් කිරීම
ii. වෙළඳ / ව්‍යාපාර සංසඳ සංවිධානය කිරීම
iii. වෙළඳ ප්‍රතිපත්ති පිළිබඳ පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පැවැත්වීම
iv. වෙළඳාම පිළිබඳ ජාතික හා අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
v. වෙළඳ පාර්ශව කරුවන් විසින් වෙළඳ ප්‍රතිපත්තියට අදාළව ඉදිරිපත් කරන ලද ගැටළු විසඳීම
vi. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා වෙළඳ ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කිරීම
vii. අන්තර්ජාතික වෙළඳාම පිළිබඳ මුදල් අමාත්‍යාංශයෙහි නියෝජිත ආයතනය වශයෙන් කටයුතු කිරීම
viii. වෙළඳ ප්‍රතිපත්තියට අදාළ අධිකරණ නඩු කටයුතු සඳහා පිළිතුරු සකස් කිරීම
ix. අමාත්‍ය මණ්ඩල සංදේශ, නිරීක්ෂණ සහ සටහන් සකස් කිරීම
x. වෙළඳාමට අදාළ අයවැය යෝජනා සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
xi. රේගු ආඥා පනතේ රෙගුලාසි ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා පහසුකම් සැපයීම
xii. තක්සේරුකරණයද ඇතුළත්ව, රේගු නඩු පිළිබඳ අභියාචනා සමාලෝචනය කිරීම
xiii. රේගු පරිපාලනය පිළිබඳ විගණන වාර්තා සමාලෝචනය කිරීම
xiv. අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය (TIEP) පිළිබඳ සම්බන්ධීකරණය
xv. බන්ධිත ගුදම් පහසුකම් පිළිබඳ ප්‍රතිපත්ති සම්බන්ධීකරණය

#### 1.7.1.2. තීරුබදු ප්‍රතිපත්තිය

i. 19 (අ) වගන්ති යටතේ තීරුබදු ඉවත් කිරීම පිළිබඳ සමායෝජනය
ii. ආදායම් සංරක්ෂණ පනත ප්‍රකාශයට පත් කිරීම
iii. තීරුබදු අක්‍රමිකතාවනට අදාළ දුක් ගැනවිලි විසඳීම
iv. සංයෝජිත වර්ගීකරණ ජාතික උප බෙදීම් කළමනාකරණය කිරීම
v. සංයෝජිත වර්ගීකරණවල අනුකූලතාව පවත්වා ගැනීම සහ අවශ්‍ය පරිදි එහි පිළිවෙළ මාරු කිරීම
vi. තීරුබදු ප්‍රතිපත්තියට අදාළ ගැටළු සහ ඊට විකල්ප විශ්ලේෂණය කිරීම
vii. විශේෂ භාණ්ඩ බදු පනත බලාත්මක කිරීම
viii. තීරුබදු ප්‍රතිපත්තිය සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම
ix. තීරුබදු ප්‍රතිපත්තිය පිළිබඳව පාර්ලිමේන්තු කටයුතු
x. තීරුබදු පිළිබඳ ජාතික සහ අන්තර්ජාතික සංවිධාන සමඟ සම්බන්ධීකරණය
xi. පාර්ශවකරුවන් විසින් ඉදිරිපත් කරනු ලබන තීරුබදු පිළිබඳ ගැටළු නිරාකරණය කිරීම

xii. අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා තීරුබදු ප්‍රතිපත්ති ප්‍රකාශ සකස් කිරීම

xiii. තීරුබදු ප්‍රතිපත්තියට අදාළ අධිකරණ නඩු කටයුතු සඳහා පිළිතුරු සකස් කිරීම

#### 1.7.1.3. නිදහස් වෙළඳ ගිවිසුම්

i. නිදහස් වෙළඳ ගිවිසුම් යටතේ ක්‍රියාත්මක කරනු ලබන මූල්‍ය ප්‍රතිපත්තිය විශ්ලේෂණය කිරීම

ii. ශ්‍රී ලංකාවේ නිදහස් වෙළඳ ගිවිසුම්වලට අනුව වෙළඳ ප්‍රතිපත්ති සමාලෝචනය සහ යාවත්කාලීන කිරීම

iii. පහත දැක්වෙන ගිවිසුම්වලට අදාළ තීරුබදු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)
- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු පාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) සහ
- ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA)

### 1.7.2 විශේෂ ව්‍යාපෘති

- රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ලබා ගැනීම සඳහා වන යෝජනා ක්‍රමය
- රාජ්‍ය පරිපාලන චක්‍ර ලේඛ අංක 22/99 යටතේ නිකුත් කරනු ලබන බලපත්‍ර
- විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ, රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා සහනදායී පදනම මත මෝටර් රථ ආනයනය කිරීමේ යෝජනා ක්‍රමය
- විවිධ තීරු බදු සහන ක්‍රම වේද යටතේ ආනයනය කරනු ලැබූ මෝටර් රථ බෙදා හැරීම
- රේගු ආඥා පනත යටතේ රේගු බදු ඉවත් කිරීම් ලබා දීම
- ආනයන සැකසුම් යෝජනා ක්‍රමය (TIEP) සඳහා ආනයනය කිරීම්
- වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම
- සාර්ක් සංවර්ධන අරමුදල

## 1.8 පරිපාලන හා මූල්‍ය අංශය

මානව, භෞතික සහ මූල්‍ය සම්පත් කළමනාකරණය සම්බන්ධ වගකීම පරිපාලන හා මූල්‍ය අංශය වෙත පැවරේ. දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් බඳවා ගැනීම, නිලධාරීන්ගේ සංවර්ධනය සහ ස්ථානගත කිරීම පිළිබඳ කාර්යයන් මානව සම්පත් කළමනාකරණයට ඇතුලත් වන අතර මූල්‍ය සහ භෞතික සම්පත් අත්පත් කර ගැනීම, නඩත්තු කිරීම සහ ඒවාට අදාල වාර්තා පවත්වා ගැනීම පිළිබඳ කාර්යයන් මූල්‍ය සහ භෞතික සම්පත් කළමනාකරණයට අයත් වේ.

# 2. වෙළඳ අංශයේ කාර්යසාධනය

## 2.1 වෙළඳ ප්‍රතිපත්තිය

ශ්‍රී ලංකාව තුළ දේශීය නිෂ්පාදන ධාරිතාවය සහ වෙළඳ කාර්ය සාධනය වැඩි දියුණු කිරීම, කලාපීය සහ ලෝක වෙළඳපල තුළ ශ්‍රී ලාංකීය හවුල්කාරීත්වය සවිබල ගැන්වීම, මහජනතාවගේ ජීවන මට්ටම උසස් කිරීම සහ රටෙහි දිගුකාලීන ආර්ථික වර්ධනය වේගවත් කිරීම ශ්‍රී ලංකාවේ වෙළඳ ප්‍රතිපත්තිය මගින් අරමුණු කෙරේ.

ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරන මූලිකාංග වනුයේ;

i. නිසි නෛතික ක්‍රමවේදයන්, සම්මුතීන්, නියාමන/නියෝග සහ ආරක්ෂණය ක්‍රියාත්මක කරන අතරවාරයේදී ශ්‍රී ලංකාවේ තීරුබදු සහ වෙනත් බදු, තීරුබදු නොවන බාධක, තාර්කික කරණය තුළින් සිදු කළ යුතු තරඟකාරිත්වය සහ සේවා අංශයන්හි සීමා ලිහිල්කරණය
ii. වෙළඳපල ප්‍රවේශය සහ වෙළඳ පහසුකම් සැලසීම - බහු පාර්ශ්වික, කලාපීය සහ ද්විපාර්ශ්වික වෙළඳ ගිවිසුම් සහ සවිස්තරාත්මක ආර්ථික හවුල්කාරීත්වයන් මෙන්ම වේගවත් රේගු ක්‍රියාපටිපාටිය සහ වැඩි දියුණු කරන ලද භාණ්ඩ ප්‍රවාහන ක්‍රම තුළින් ශ්‍රී ලංකාවේ අපනයනකරුවන් සඳහා විදේශ වෙළඳපොළ විවර කිරීම
iii. සාර්ව ආර්ථික සමබරතාව, ප්‍රතිපත්ති සහ ආයතනික ඒකාබද්ධතාවය - වෙළඳ ශේෂය සහ රාජ්‍ය ආදායම මත වෙළඳ ලිහිල්කරණයෙහි බලපෑම ක්‍රියාත්මක කරනු ලබන සාර්ව ආර්ථික ප්‍රතිපත්තිය, වෙළඳ හා ආයෝජන බැඳීම්, වෙළඳ හා ආයෝජන සම්බන්ධතා සහ ප්‍රතිපත්ති, ආයතනික සම්බන්ධීකරණය සහ විධිමත්කරණය
iv. ආයතනික හා පුද්ගල හැඩගැස්වීම - දේශීය සහ විදේශීය වෙළඳපල තුළදී ඉහළ තරඟකාරිත්වයට මුහුණ දීමට සිදුවන ශ්‍රී ලාංකික ආයතනයන්ට සහාය වීම සඳහා පියවර ගැනීම සහ එකී තරඟකාරිත්වයෙහි බලපෑමට ලක් විය හැකි පිරිස මත ඇතිවන ප්‍රතිවිපාකය අවම කිරීමටත් කටයුතු කිරීම හා එයට මුහුණදීම සඳහා සකස් වීමට කාලය ලබා දීම

දේශීය කර්මාන්තයන්හි අපේක්ෂාවන් සඳහා පහසුකම් සලසන අතරවාරයේදීම ගෝලීය නිදහස් වෙළඳපොළ ආර්ථිකය තුළ පවතින ධනාත්මක අංශයන් සමඟ ශ්‍රී ලාංකීය සම්බන්ධතාව ඇති කිරීමේ අරමුණින් යුතුව රටෙහි වර්තමාන වෙළඳ පාලනයෙහි වැඩිදුර ලිහිල්කරණ ක්‍රියාවලියක් සමඟින් ක්‍රියාත්මක විදේශ වෙළඳාම, රටෙහි ආර්ථිකයෙහි අවිච්ඡින්න අංගයකි.

වර්තමානයේදී, ආනයන හෝ අපනයන පිළිබඳව බලපත්‍ර හෝ කෝටා ආදී සීමාකිරීම් බහුලව දැකිය නොහැකි අතර, භාණ්ඩ වෙළඳපොළ තුළ වෙළඳාම සඳහා සාධාරණ සමබර තත්ත්වයක් නිර්මාණය කිරීම සඳහා පවතින ප්‍රධාන මෙවලම් වශයෙන් තීරුබදු සහ දේශ සීමා බදු ක්‍රියාත්මක වෙමින් පවතී. විදේශ වෙළඳ අංශය තුළ සියලු පාර්ශවකරුවන් සඳහා විනිවිද භාවය සහ පූර්වානුමානයන් සිදුකළ හැකි රාමුවක් සැපයීම රජයේ තීරුබදු ප්‍රතිපත්තියෙහි අරමුණයි.

ශ්‍රී ලංකාවෙහි වර්තමාන තීරුබදු ව්‍යුහය 0%, 15% සහ 30% වශයෙන් කාණ්ඩ 03 තීරුබදු ව්‍යුහයක් යටතේ 0% සිට 30% දක්වා පරාසයක පවතී. මෙයින් 0% ප්‍රතිශතය අත්‍යාවශ්‍ය භාණ්ඩ සහ මූලික අමුද්‍රව්‍ය මතද 15% ප්‍රතිශතය අතරමැදි නිෂ්පාදන මතද 30% ප්‍රතිශතය වෙනත් නිමි නිෂ්පාදන මතද අදාළ වේ.

## 2.2. වෙළඳ ගිවිසුම්

තීරුබදු, ආනයන කෝටා, අපනයන සීමා කිරීම් සහ වෙනත් වෙළඳ තීරුබදු අඩු කිරීම / ඉවත් කිරීම තුළින් බහු පාර්ශවික සහ ද්වීපාර්ශවික වෙළඳ ගිවිසුම්, වාණිජ සබඳතා වැඩිදියුණු කිරීම සහ වෙළඳාම හා ආයෝජන පහසුකරණයත් සම්බන්ධයෙන් හිතකර වේ. බොහෝවිට වෙළඳ ගිවිසුම් තුළට ආයෝජනය පිළිබඳ සහතිකවීමක් ඇතුළත් වන අතර මෙම වෙළඳ ගිවිසුම් මගින් වෙළඳ හිඟය පියවා ගැනීම සඳහා ද සහාය ලැබේ. තීරුබදු, තීරුබදු නොවන බදු සහ සමස්ත තහනම් කිරීම් වැනි ඒකපාර්ශවික වෙළඳ බාධක මගින් ජාත්‍යන්තර වෙළඳාම නිරන්තර නියාමනයට ලක් වේ. රටවල් කිහිපයක් හෝ කලාප කිහිපයක්, වෙළඳ බාධක අඩු කිරීම සඳහා එකඟ වන විට ජාත්‍යන්තර වෙළඳාමෙන් ලැබෙන ආර්ථික වාසි සවිබල ගැන්වීමටත් වැඩිදියුණු කිරීමටත් ඉඩ ලැබේ. ශ්‍රී ලංකාව ද වෙළඳ ගිවිසුම් ගණනාවක් සම්බන්ධයෙන් අත්සන් තැබූ පාර්ශවයකි.

**ක්‍රියාත්මක මට්ටමේ පවත්නා වෙළඳ ගිවිසුම්**

- ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)
- පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA)
- දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)
- ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)
- ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම (SLSFTA)

**සාකච්ඡා මට්ටමේ පවතින වෙළඳ ගිවිසුම්**

- බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු පාර්ශවීය ගිවිසුම (BIMSTEC)
- යෝජිත චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (CSFTA) සහ
- ආර්ථික හා තාක්ෂණ සහයෝගීතා ගිවිසුම (ETCA)
- ශ්‍රී ලංකා තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම

**යෝජනා මට්ටමේ පවතින වෙළඳ ගිවිසුම්**

- බංගලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

වෙළඳ ලිහිල්කරණයෙහි මූලික අදියරයන්හිදී ශ්‍රී ලංකාව විසින් ඇතුළත් වූයේ භාණ්ඩ වෙළඳාම් ලිහිල්කරණය කෙරෙහි වැඩි වශයෙන් අවධානය යොමු කරන ලද ද්වීපාර්ශ්වික හා බහු පාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම්වලටය. ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA), පකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) ද්වීපාර්ශ්වික නිදහස් වෙළඳ ගිවිසුම්වලට උදාහරණ වේ. දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA) සහ ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA) භාණ්ඩ වෙළඳාම ලිහිල්කරණය පිළිබඳව බහුපාර්ශ්වික වෙළඳ ගිවිසුම් වේ. පසුකාලීන අදියරයන්හිදී මෙමගින් සේවා වෙළඳාම, ආයෝජනය හා රේගු සංස්ථාපනය වැනි අංශයන් කෙරෙහි අවධානය යොමු කර තිබුණි.

වෙළඳ ගිවිසුම්වලට ඇතුළත්වීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාවේ ප්‍රධාන අරමුණු වන්නේ මෙරට ප්‍රබල කර්මාන්තයන් සංවර්ධනය කොට ආරක්ෂා කර ගන්නා අතරවාරයේම ඉහළ ඒක පුද්ගල ආදායමක් හිමිකර ගැනීම, සංචාරක පාරාදීසයක් බවට පත් වීම සහ ආයෝජන කේන්ද්‍රයක් බවට ප්‍රවර්ධනය වීමයි. කෘෂි කර්මාන්තය සහ කර්මාන්ත අංශයන් තුළ පැවතිය හැකියැයි අපේක්ෂිත ශ්‍රම හිඟය යන සන්දර්භය තුළ, සේවා වෙළඳාම යනු කලින්ම සැලසුම්

කළ යුතු සියුම් විෂය ක්ෂේත්‍රයකි. ඒ අනුව, සුදුසු ආයෝජන ආකර්ෂණය කර ගැනීම සඳහාත්, පරිපූර්ණ ආර්ථික සහයෝගීතාවය සඳහා රාමු නිර්මාණය කිරීම තුළින් සේවා වෙළඳාම සඳහා හිතකර පරිසරයක් ගොඩ නැංවීම සඳහා ඉහළ ප්‍රමුඛත්වය ලබා දෙන ලදී.

### 2.2.1. වෙළඳ ගිවිසුම්වල ප්‍රගතිය

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, වාණිජ දෙපාර්තමේන්තුවෙහි උපදෙස් ඇතිව වෙළඳ ගිවිසුම් යටතේ තීරුබදු සංශෝධන ක්‍රියාත්මක කිරීම සඳහා පසු විපරම් සිදු කරන ලදී. ඒ අනුව, තීරු බදු ලිහිල්කරණ වැඩසටහනද ඇතුළත්ව වෙළඳ ගිවිසුම් ක්‍රියාවට නැංවීම සම්බන්ධයෙන් පසුගිය වර්ෂය තුළදී පහත දැක්වෙන ප්‍රගතිය අත්කර ගෙන තිබේ.

#### 2.2.1.1. ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA)

මෙම ගිවිසුම 1998 දෙසැම්බර් 28 වන දින අත්සන් කරනු ලැබ, 2000 මාර්තු 01 වන දින සිට බලාත්මකව පවතින අතර දෙරට අතර ආයෝජන පහසුකරණය සඳහා ඉඩ සැලසෙන ද්වි පාර්ශ්වික ආයෝජන ගිවිසුම හරහා ඉන්දියාව හා ශ්‍රී ලංකාව අතර ද්වි පාර්ශ්වික වෙළඳාම හා ආයෝජනය වැඩිදියුණු කිරීම තුළින් දෙරටෙහි ආර්ථික සබඳතා ප්‍රවර්ධනය කිරීම අරමුණු කෙරේ. මෙම ගිවිසුම මඟින් භාණ්ඩ වෙළඳාම පමණක් ආවරණය කරනු ලබන අතර දෙරට විසින් තීරුබදු රහිත පදනම හෝ සහන පදනම මත එකිනෙකාගේ අපනයන භාණ්ඩ සඳහා තම රටෙහි වෙළඳපොළ ප්‍රවේශය ලබා දිය යුතුය.

ගිවිසුම යටතේ ඉන්දියාව වෙත යැවෙන එළවළු තෙල්, මූලික තඹ, මාගරින්, කිරිගරුඬ සහ ගම්මිරිස් වැනි ප්‍රධාන අපනයනයන්හි අඩුවීමක් පෙන්නුම් කළද, වෙනත් නිෂ්පාදන රැසක් සඳහා ඉන්දියානු වෙළඳපොළ ප්‍රවේශය ලැබී තිබේ. එම නිෂ්පාදන භාණ්ඩ වන්නේ විද්‍යුත් පරිවාරක වයර් සහ රැහැන්, කුකුළු ආහාර, වායු සහිත ටයර, පිඟන් භාණ්ඩ, නිමි ඇඳුම්, ගෘහ භාණ්ඩ, වායු සිසිලන හා වායු සමීකරණ යන්ත්‍ර, කිරුම් මිනුම් උපකරණ, වීදුරු බෝතල්, සැකසූ මාංශ නිෂ්පාදන, එම්.ඩී.එෆ්.බෝඩ්, රබර් අත්වැසුම්, තාප මුද්‍රණ කඩදාසි, පිඟන් ගඩොල්, පාෂාණ සහ කිරි ගරුඬ, බොයිලේරු සහ යන්ත්‍ර සූත්‍ර කොටස්, ලෝහ සහ වානේ භාණ්ඩ, ජනේල පුවරු සහ ආවරණ ගෝනි සහ බෑග් වර්ග ආදියයි.

වගුව **2.1 - ඉන්දු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද මුළු ආනයන සහ අපනයන වටිනාකම 2017/2018**

| 2017 | | 2018 | |
|---|---|---|---|
| ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන | ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන |
| 43,273 | 72,108 | 41,273 | 81,929 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ පවතින කරුණු වර්තමාන ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුමෙහි (ETCA) රැස්වීම්වලදී සාකච්ඡාවට භාජනය වේ. ඊට අමතරව, ආර්ථික සහ තාක්ෂණික සහයෝගීතා ගිවිසුම යටතේ වෙළඳ පහසුකරණය (Trade Facilitation) වැඩි දියුණු කිරීම සඳහා වාණිජ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව අදාළ පාර්ශවකරුවන් සමඟ ආර්ථික සාකච්ඡාවන් පවත්වා තිබේ.

### 2.2.1.2 පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2005 ජුනි 12 දින සිට බලාත්මක වූ මෙම ගිවිසුම හේතුවෙන් වෙළඳ අංශය තුළ සැලකිය යුතු වර්ධනයක් වාර්තා වී තිබේ. මෙම ගිවිසුම යටතේ වූ අවසන් අදියරෙහි වෙළඳ බැඳීම ද පකිස්තානය විසින් 2009 මාර්තු මස ක්‍රියාවට නැංවූ අතර, වර්තමානයේ තීරු බදු රහිත නිෂ්පාදන 4500කට වැඩි සංඛ්‍යාවක් සඳහා ශ්‍රී ලංකාවට පකිස්තානු වෙළඳපොළ ප්‍රවේශය ඇත. එමෙන්ම මෙම ගිවිසුම සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සතුව වෙළඳ බැඳීම් අදියරයන් සියල්ල ද 2010 නොවැම්බරයේදී සපුරා ඇත. ශ්‍රී ලංකාව විසින් පකිස්තානය වෙත අපනයනය කරන ප්‍රධාන භාණ්ඩ අතරට ගම්මිරිස්, බීඩි කොළ, බුලත් කොළ, පොල්කටු කැබලි, ස්වභාවික රබර්, වියළි හෝ නැවුම් පොල් සහ කජු, දැව සහ දැව භාණ්ඩ වර්ග, ආහාරයට ගතහැකි එළවළු සහ තේ ඇතුළත් වේ.

එමෙන්ම, පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමට එළඹීමෙන් පසුව පකිස්තානු වෙළඳපොළ වෙත තවත් භාණ්ඩ වර්ග ගණනාවක් පිවිස තිබේ. එනම්, නැවුම් අන්නාසි, ක්‍රීඩා භාණ්ඩ, ඇට සහිත සියඹලා, ආහාරයට ගත හැකි තෙල් වර්ග, ශාකසාර රූපලාවන්‍ය නිෂ්පාදන සහ ප්ලාස්ටික් භාණ්ඩ, තීන්ත වර්ග, වීදුරු ආලේපන තීන්ත, සම් භාණ්ඩ නිෂ්පාදන, අධි ශීත කරන ලද මාළු, ඉස්සන්, පොකිරිස්සන්, කකුළුවන්, කැපූ මල් සහ ශාක පත්‍ර, මැණික් හා ස්වර්ණාභරණ සහ ජල තටාක මසුන් වේ.

මේ වන විට දෙරටම විසින් තීරුබදු ලිහිල්කරණ වැඩසටහන යටතේ මෙම ගිවිසුමට අදාළ අදියර බැඳීම් (phasing out commitment) සම්පූර්ණ කොට ඇති අතර භාණ්ඩ වර්ග 4500කට අධික සංඛ්‍යාවක් සඳහා දෙරට අතර තීරුබදු රහිත වෙළඳපොළ වෙත ප්‍රවේශ ඇතිව සිටී. පකිස්තානු - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සඳහා ආනයන අපනයන වටිනාකම් 2.2 වගුවේ දැක්වේ.

**වගුව 2.2 - පකිස්තාන් - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව විසින් සිදුකරන ලද මුළු ආනයන සහ අපනයන වටිනාකම - 2017/2018**

| 2017 | | 2018 | |
|---|---|---|---|
| ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන | ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන |
| 2,325 | 9,320 | 12,062 | 8,772 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව

බාස්මතී සහල්, අර්තාපල්, වානේ, එළවළු සහ පළතුරු සම්බන්ධයෙන් මතු වූ ගැටළු පිළිබඳව වාණිජ දෙපාර්තමේන්තුව සහ අදාළ වෙනත් පාර්ශවකරුවන් සමඟ සාකච්ඡා පවත්වා තිබේ.

### 2.2.1.3 දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම (SAFTA)

සාර්ක් වරණීය වෙළඳ ගිවිසුම 1993 අප්‍රේල් මාසයේදී අත්සන් කරනු ලැබ 1995 දෙසැම්බර් සිට ක්‍රියාත්මක විය. මෙම ගිවිසුමෙහි අරමුණ වන්නේ, සහන සැලසීම මඟින් සාමාජික රටවල් අතර අන්‍යෝන්‍ය වෙළඳ සහ ආර්ථික සහයෝගීත්වය ප්‍රවර්ධනය කිරීමයි.

කෙසේ වෙතත්, වරණීය වෙළඳ ගිවිසුමකින් ඔබ්බට වර්ධනය වීමේත් කලාපය තුළ වඩා ඉහළ මට්ටමේ වෙළඳ හා ආර්ථික සහයෝගීත්වයක් දක්වා ගමන් කිරීමේත් අවශ්‍යතාවය සාමාජික රටවල් විසින් හඳුනාගෙන ඇත. මෙහි ප්‍රතිඵලයක් වශයෙන් 2004 ජනවාරි මාසයේදී ඉස්ලාමාබාද්හිදී සාර්ක් කවුන්සිලයේ අමාත්‍යවරු විසින් දකුණු

ආසියානු නිදහස් වෙළඳ ප්‍රදේශය සම්බන්ධයෙන් ව්‍යුහාත්මක ගිවිසුමක් අත්සන් කරන ලදී. එය 2006 ජනවාරි 01 වන දින සිට බලාත්මක විය.

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ එන තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි (TLP) පළමු අදියර 2015 වසරේදී සම්පූර්ණ කරන ලදී. මෙම ගිවිසුමෙහි දෙවන අදියරෙහි තීරුබදු ලිහිල්කරණ වැඩසටහන යටතේ සංවේදී ලැයිස්තුවෙහි භාණ්ඩ කිහිපයක් නිදහස් කිරීම සඳහා ශ්‍රී ලංකාව විසින් ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. මේ සම්බන්ධයෙන් ඌන සංවර්ධිත නොවන රටවල් යටතේ වන, ඉතිරිව පවතින භාණ්ඩ ලැයිස්තු තීරුබදු ලිහිල්කරණ වැඩසටහනෙහි දෙවන කොටසෙහි අවසාන අදියරෙහිදී නිදහස් කිරීම සඳහා තෝරාගෙන ඇත. සාර්ක් රටවල් අතර ඇති අනාගත අන්‍යෝන්‍ය එකඟතාව මත වැඩසටහනෙහි තෙවන අදියර ක්‍රියාවට නැංවෙනු ඇත.

සංවේදී ලැයිස්තුවට ඇතුළත් භාණ්ඩ සංඛ්‍යාව සහ තෙවන අදියර යටතේ සාමාජික රටවල් විසින් එකඟ වූ ප්‍රතිශතමය අඩු කිරීම් පහත සඳහන් වගුවේ දැක්වෙන පරිදි වේ.

**වගුව 2.3 – දෙවන අදියරේදී එක් එක් සමාජික රට විසින් පවත්වා ගන්නා සංවේදී ලැයිස්තුවට ඇතුළත් භාණ්ඩ වර්ග සහ තෙවන අදියර යටතේ අඩු කිරීමට එකඟ වූ ප්‍රතිශතමය අගය**

| සාමාජික රාජ්‍යය | සංවේදී නිෂ්පාදන පිළිබඳ මුල් ලැයිස්තුවල ඇති භාණ්ඩ ගණන | සංශෝධනය කරන ලද සංවේදී ලැයිස්තුවල ඇති නිෂ්පාදන ගණන (දෙවන අදියර) | තෙවන අදියර යටතේ එකඟ වූ අඩු කිරීම් ප්‍රතිශතය |
|---|---|---|---|
| **(1)** | **(2)** | **(3)** | **(4)** |
| ඇෆ්ගනිස්තානය | 1072 | 850 | 20% |
| බංගලාදේශය | 1233 (ඌන සංවර්ධිත රටවල්)<br>1241 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 987 (ඌන සංවර්ධිත රටවල්)<br>993 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 20% |
| භූතානය | 150 | 156 | අදාළ නොවේ |
| ඉන්දියාව | 480 (ඌන සංවර්ධිත රටවල්)<br>868 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 25 (ඌන සංවර්ධිත රටවල්)<br>614 (ඌන සංවර්ධිත නොවන රටවල්) | ඌන සංවර්ධිත නොවන රටවල් සඳහා පමණක් 20% |
| මාලදිවයින | 681 | 154 | අදාළ නොවේ |
| නේපාලය | 1257 (ඌන සංවර්ධිත රටවල්)<br>1295 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 998 (ඌන සංවර්ධිත රටවල්)<br>1036 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 20% |
| පකිස්තානය | 1169 | 936 | 20% |
| ශ්‍රී ලංකාව | 1042 | 837 (ඌන සංවර්ධිත රටවල්)<br>963 (ඌන සංවර්ධිත නොවන රටවල්) | 10% |

මූලාශ්‍රය - දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම් ලේකම් කාර්යාලය

දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ 2017 සහ 2018 සඳහා වෙළඳ දත්ත 2.4 වගුවේ දැක්වේ.

**2.4** වගුව දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදුකරන ලද මුළු අපනයන හා ආනයන වටිනාකම **2017 සහ 2018**

| 2017 | | 2018 | |
|---|---|---|---|
| ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන | ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන |
| 1,295 | 8,879 | 1,215 | 9,237 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 2017/2018

### 2.2.1.4. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම (APTA)

කලින් බැංකොක් ගිවිසුම වශයෙන් හැඳින්වූ, 1975 දී අත්සන් කරන ලද ආසියා ශාන්තිකර නිදහස් වෙළඳ ගිවිසුම යනු, ආසියාව තුළ ක්‍රියාත්මක ඉපැරණි බහු පාර්ශවීය වරණීය වෙළඳ ගිවිසුම්වලින් එකකි. මෙම ගිවිසුමට බංගලාදේශය, චීනය, ඉන්දියාව, ලාඕසය, කොරියනු ජනරජය සහ ශ්‍රී ලංකාව යන රාජ්‍යයන් අයත් වේ.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යනු ශ්‍රී ලංකාව සඳහා හිතකර ප්‍රතිඵල ඇති කිරීම සම්බන්ධයෙන් බැහැර නොකළ හැකි බහු පාර්ශවීය ගිවිසුමකි. ශ්‍රී ලංකාව, චීනය සහ කොරියානු ජනරජය සමඟ වෙළඳාම් කිරීමට ඉඩ සලසන එකම වෙළඳ ගිවිසුම මෙය වන බැවින්, ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම ශ්‍රී ලංකාවට විශේෂයෙන් වැදගත් වේ.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලාංකීය ප්‍රධාන අපනයන වන්නේ, කොහු නිෂ්පාදන, තේ, ස්වභාවික රබර්, නිමි ඇඳුම්, මත්ස්‍ය නිෂ්පාදන, සක්‍රීය කාබන්, දැව ගෘහ භාණ්ඩ, රිදී ආභරණ සහ පිඟන් මැටි භාණ්ඩය.

ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි ස්ථාවර කමිටුවෙහි 51 වැනි සැසි වාරය 2017 සැප්තැම්බර් 28 -29 දිනවල ශ්‍රී ලංකාවේද පැවැත්විණි. සියළුම සාමාජික රටවල් 2018 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි තීරු බදු සහන ලබා දීමේ සිව්වන වටය ක්‍රියාත්මක කිරීමට එකඟ විය.

සංයෝජිත වර්ගීකරණ 2017 සංශෝධනයෙහි සිව්වැනි වටයේදී ශ්‍රී ලංකාව තීරු බදු සංකේත 143 ක් සඳහා තීරු බදු සහන ලබාදීමට එකඟ වූ අතර, එම ප්‍රමාණය සංයෝජිත වර්ගීකරණ 2017 අනුව 154 ක් විය. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි සිව්වන වටයේ බදු සහන 1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ 2018.03.16 දිනැති අංක 2062/45 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ක්‍රියාත්මක කොට ඇත. ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුමෙහි සිව්වන වටයේ තීරු බදු සහන ලබාදීමෙන් පසු වර්තමානයේදී තීරුබදු සහන ප්‍රතිශතය සහිත තීරු බදු සංකේත 644ක් පවතී (සංයෝජිත වර්ගීකරණ 2017 සංශෝධනය).
ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ 2017/2018 සඳහා වෙළඳ දත්ත 2.5 වගුවේ දැක්වේ.

**2. 5** වගුව **-** ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ ශ්‍රී ලංකාව සිදු කරන ලද මුළු ආනයන හා අපනයන වටිනාකම **2017/2018**

| 2017 | | 2018 | |
|---|---|---|---|
| ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන | ආනයන වටිනාකම රු.මිලියන | අපනයන වටිනාකම රු.මිලියන |
| 3,720 | 24,431 | 3,076 | 108,018 |

මූලාශ්‍රය - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව 2017/2018

### 2.2.1.5 ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම

ශ්‍රී ලංකා රජය 2018 ජනවාරි 23 වන දින සිංගප්පූරු රජය සමඟ නිදහස් වෙළඳ ගිවිසුමට ඇතුළත් විය. ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යනු භාණ්ඩ හා සේවා වෙළඳාම මෙන්ම රාජ්‍ය ප්‍රසම්පාදනය සහ ඍජු විදේශ ආයෝජන ප්‍රවාහන යන අංශ ආවරණය කරන්නා වූ පුළුල් ද්විපාර්ශ්වික ගිවිසුමකි. මෙම ගිවිසුමෙහි ආරම්භක අවධියේදී, ගිවිසුම යටතේ තීරු බදු රහිත භාණ්ඩ ලැයිස්තුවක් වශයෙන් සංයෝජිත වර්ගීකරණ (තීරුබදු සංකේත) 3,535ක් 2018 මැයි 01 දිනැති අංක 2069/02 අංක දරණ ගැසට් නිවේදනය මඟින් ප්‍රසිද්ධ කොට ඇති අතර එය දැනට ක්‍රියාත්මක වෙමින් පවතී.

### 2.2.1.6 බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංශික ගිවිසුම (BIMSTEC)

බෙංගාල බොක්ක ආශ්‍රිත වෙරළබඩ තීරයේ සහ යාබද ප්‍රදේශවල පිහිටා ඇති කලාපීය ඒකාබද්ධතාවයෙන් යුතු සත් සාමාජික රටවලින් සැදි සංවිධානයකි. මෙම උප කලාපීය සංවිධානය 1997 ජූනි 06 වැනි දින සිට බැංකොක් ප්‍රකාශනය තුළින් ක්‍රියාත්මක විය. මෙම සංවිධානයට අයත් සාමාජික රටවල් හතෙන් රටවල් පහක් දකුණු ආසියානු රටවලිනි. එනම්, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, නේපාලය සහ ශ්‍රී ලංකාව වේ. සෙසු රාජ්‍යයන් වන්නේ අග්නිදිග ආසියාවට අයත් මියන්මාරය සහ තායිලන්තයයි. මෙම කලාපීය සංවිධානය මඟින් දකුණු ආසියාව සහ අග්නිදිග ආසියාව අතර සබඳතාවයක් මෙන්ම සාර්ක් සහ ආසියානු සංවිධානවල සාමාජික රටවල් අතරද අන්තර් කලාපීය සහයෝගීතාවයක් නිර්මාණය කෙරේ.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ බහු ආංශික ගිවිසුමෙහි මූලික අරමුණ වන්නේ බෙංගාල බොක්ක ආශ්‍රිත දකුණු ආසියාතික සහ අග්නිදිග ආසියාතික රටවල් අතර තාක්ෂණික සහ ආර්ථික සහයෝගීතාව ප්‍රවර්ධනය කිරීමයි.

එමෙන්ම, මෙම සංවිධානය යනු එක් එක් විවිධ ක්ෂේත්‍රයන්හි සාර්ථකත්වය අත්කර ගැනීම සඳහා අභිප්‍රේරණයක් සහිතව කටයුතු කරන්නක් වන අතර, 1997 අග භාගයේදී ආංශික සහයෝගීතාවය සඳහා වෙළඳාම සහ ආයෝජනය, තාක්ෂණය, බලශක්තිය, ප්‍රවාහනය, සංචාරක කර්මාන්තය සහ ධීවර කර්මාන්තය ඇතුළත් අංශ 06කින් ආරම්භ වූ මෙම සංවිධානය 2008 වර්ෂයේදී ඊට කෘෂි කර්මාන්තය, මහජන සෞඛ්‍යය, දිළිඳු බව තුරන් කිරීම, ත්‍රස්තවාදය පිටු දැකීම, පරිසරය, සංස්කෘතිය, මිනිසුන් අතර සබඳතාවය, දේශගුණික විපර්යාස යන අංශද ඇතුළත් කර ගනිමින් වඩාත් පුළුල් සංවිධානයක් බවට පත් විය.

වෙළඳාම සහ ආයෝජනය යනු බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ ආරම්භක අදියරේදී පැවති අංශ හයෙන් එකකි. මේ යටතේ බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ නිදහස් වෙළඳ ප්‍රදේශය සම්බන්ධ ගිවිසුම 2004 පෙබරවාරි 08 වැනි දින තායිලන්තයේ ෆුකට් හිදී අත්සන් කරනු ලැබ 2004 ජූනි 30 දින සිට බලාත්මකව පවතී. මෙම ගිවිසුම යටතේ 2004 වර්ෂයේදී, වෙළඳ සාකච්ඡා කමිටුවක් (ශ්‍රී ලංකාවෙහි ස්ථාවර සභාපතීත්වය යටතේ) ස්ථාපිත කොට ඇති අතර මේ දක්වා සාකච්ඡා වට 20ක් පවත්වා තිබේ. මෙම වෙළඳ සාකච්ඡා කමිටුව විසින් භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, රේගු කටයුතු පිළිබඳ සහයෝගීත්වය සහ අන්‍යෝන්‍ය සහාය, ක්‍රියාකාරීත්වය සහතික කිරීම පිළිබඳ ප්‍රභවය සහ ක්‍රියා පටිපාටි, වෙළඳාම පහසුකරණ යන අංශ ගණනාවකට අදාළව ව්‍යුහාත්මක ගිවිසුම් සම්බන්ධයෙන් සාකච්ඡා ආරම්භ කොට ඇත.

බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල තාක්ෂණ හා ආර්ථික සහයෝගීතාව සඳහා වූ ගිවිසුමේ වෙළඳ සාකච්ඡා කමිටුවෙහි 21 වැනි රැස්වීම් වාරය 2018 නොවැම්බර් 18 – 19 යන දිනවල බංගලාදේශයේ ඩකා නුවරදී පැවැත්විණි.

එම රැස්වීමේදී වෙළඳ සාකච්ඡා කමිටුවෙහි 19 වන රැස්වීමේදී අනුගමනය කිරීමට එකඟ වූ ප්‍රකාර පිරිනැමුම් ලැයිස්තු (Offer list) සකස් කිරීමටත් ඒවා සංයෝජිත වර්ගීකරණ 2017 සංශෝධන තුළ ස්ථානගත කිරීමටත් තීරණය කරන ලදී. එසේ ස්ථානගත කිරීමෙන් පසුව, වෙළඳ සාකච්ඡා පිළිබඳව 19 වන රැස්වීමේදී එකඟ වූ ආකෘති භාවිතා කරමින් තීරුබදු අදාළ වීම 2017 අගෝස්තු මස 01 දින සිට සිදු වේය යන පදනම මත සංයෝජිත වර්ගීකරණ 2017 සංස්කරණයෙහි උපලේඛන සකස් කිරීමටත් මෙම උපලේඛන සාමාජික රටවල් අතර හුවමාරු කර ගැනීමටත් තීරණය කරන ලදී. ඊට අමතරව, 2017 අගෝස්තු 01 දිනට අදාළ කරගත හැකි තීරුබදු ඉවත් කිරීමේ / අඩු කිරීමේ පාදක අනුපාතයන් භාවිතා කිරීමටද තීරණය කරන ලදී.

එමෙන්ම, එකඟ වූ ප්‍රකාරය ඇතුළත තම පිරිනැමුම් ලැයිස්තු සංශෝධනය කිරීමට බලාපොරොත්තු වන රටවල්වලට මීට පෙර ඉදිරිපත් කරන ලද උපලේඛනවල තීරුබදුවලින් 10%ක් දක්වා සාමාජික රටවල් අතර හුවමාරු කෙරේ යන පදනමේ එසේ කළ හැකි බවටද තීරණය කරන ලදී.

එබැවින්, මෙම දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලද ඉහත සඳහන් නිර්නායක අනුව ශ්‍රී ලංකාවේ පිරිනැමුම් ලැයිස්තුව ද සංශෝධනය කොට ඇති අතර වැඩිදුර උපදෙස් සඳහා එහි කෙටුම්පත වාණිජ දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත.

**2.2.1.7 යෝජිත ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම**

යෝජිත ඉන්දියා - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම පිළිබඳව සාකච්ඡාවල 7 වැනි වාරය 2017 දෙසැම්බර් මස කොළඹදී පැවැත්විණි. අදාළවන පොදු ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජන සහ සාමාන්‍ය කරුණු විධිවිධාන සම්බන්ධයෙන් ක්‍රියාකාරී සමූහ අතර ඒකාබද්ධ රැස්වීම් / සාකච්ඡා වාරයන් පැවැත්විණි. එමෙන්ම දෙරට විසින්ම වෙළඳ ගිවිසුම යටතේ අයුතු වාසියක් ලබා නොගන්නා බවට සහතික කිරීම සඳහා ගත හැකි සඵලදායක පියවර පිළිබඳවද සාකච්ඡා කෙරිණි.

යෝජිත ඉන්දීය - ශ්‍රී ලංකා ආර්ථික හා තාක්ෂණික සහයෝගීතා ගිවිසුම පිළිබඳව සාක්ච්ඡා වාර 04ක් (08 වැනි, 09 වැනි, 10 වැනි සහ 11 වැනි වාරය වශයෙන්) 2018 වසරේදී පවත්වා තිබේ.

සාකච්ඡා වාරවල 08 වැනි වටය 2018 පෙබරවාරි 21-22 දක්වා ඉන්දියාවේ නව දිල්ලි නුවරදී පැවැත්විණි. මෙම සාකච්ඡා සාමාන්‍ය විධි විධාන සහ භාණ්ඩ වෙළඳාම, වෙළඳ පිළියම්, වෙළඳ ප්‍රභව රීති, රේගු ක්‍රියා පටිපාටිය සහ වෙළඳ පහසුකරණය, සේවා වෙළඳාම, ආයෝජනය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය, ගැටළු විසඳීම, සාමාන්‍ය ව්‍යතිරේක සහ අවසන් විධි විධාන, සනීපාරක්ෂක සහ ස්වස්ථතා ක්‍රමවේද, වෙළඳාම සම්බන්ධ බාධක පිළිබඳ ක්‍රියාකාරී සමූහ විසින් මෙම සාකච්ඡා වටයන් තුළදී සාකච්ඡා සිදු කරන ලදී.

09 වැනි වටයේ සාකච්ඡා වාරයන් 2018 මැයි 23-25 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹදී පවත්වන ලදී. මෙම සාකච්ඡා තුලදී දෙපාර්ශවය විසින් ම තීරු බදු ලිහිල්කරණ වැඩසටහන් විෂය පථය සහ මට්ටම සම්බන්ධයෙන් සාකච්ඡා කිරීමට පෙරාතුව, ඒ පිළිබඳව පොදු අරමුණක් ඇති කිරීමේ අරමුණින් යුතුව ඉන්දීය - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි තීරුබදු ලිහිල්කරණ වැඩ සටහනෙහි ආකෘතිය පිළිබඳ ආරම්භක සාකච්ඡා පවත්වා ඇත.

10 වැනි වටයේ සාකච්ඡා වාරයන් 2018 අගෝස්තු 2-4 දක්වා ඉන්දියාව නව දිල්ලි නුවරදී පැවැත්වූ අතර එහිදී දෙපාර්ශවයම ආර්ථික හා තාක්ෂණික සහයෝගිතා ගිවිසුමෙහි වෙළඳ භාණ්ඩ පිළිබඳ ඉලක්කගතව තීරු බදු ලිහිල්කරණය ඉවත්කිරීමට අදාළ භාණ්ඩ /නිෂ්පාදන පිළිබඳව ආරම්භක සාකච්ඡා පවත්වා ඇත.

එමෙන්ම, දෙපාර්ශවය විසින් ම ඉල්ලීම් ලැයිස්තු මීළඟ සාකච්ඡා වටයට පෙර හුවමාරු කර ගැනීම සඳහා එකඟ වී ඇත.

11 වැනි වටයේ සාකච්ඡා වාරයන් 2018 ඔක්තෝම්බර් 3-5 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ නගරයේදී පැවැත්විණි. එහිදී දෙපාර්ශවයම සංවේදී ලැයිස්තුවල සඳහන් තීරු බදු ලිහිල්කරණය ලබා දිය යුතු තීරු බදු සංකේතයන් අංක 08 ක සංකේතයක් මඟින් හැඳින්විය යුතු බවට එකඟ විය. එමෙන්ම, ඉල්ලීම් ලැයිස්තු සකස් කළ යුත්තේ තීරු බදු සහන අපේක්ෂා කරනු ලබන ජාතික තීරු බදු සංකේත මත පදනම්ව බවට ද දෙපාර්ශවය විසින් එකඟ වනු ලැබිණ. එමෙන්ම, දෙරට විසින්ම වෙළඳ ගිවිසුම යටතේ අයුතු වාසියක් ලබා නොගන්නා බවට සහතික කිරීම සඳහා ගත හැකි පියවරයන් පිළිබඳව ද මෙහි දී සාකච්ඡා කරන ලදී.

**2.2.1.8 යෝජිත චීන ශ්‍රී ලංකා වෙළඳ ගිවිසුම**

චීනය හා ශ්‍රී ලංකාව අතර වෙළඳ ගිවිසුමක් ඇති කිරීම සම්බන්ධයෙන් 2014 මාර්තු මස පැවති ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යයනයෙහි ප්‍රතිඵලය වූයේ එවැනි වෙළඳ ගිවිසුමක් මඟින් දෙරට අතර ද්වීපාර්ශ්වික වෙළඳ හා ආර්ථික සබඳතාවන් තවදුරටත් වර්ධනය වීම හා වෙළඳ ප්‍රතිලාභ හුවමාරු කර ගත හැකි බවට නිගමනය කිරීමයි.

මෙම ගිවිසුම සම්බන්ධ 5 වැනි සහ 6 වැනි වටයේ සාකච්ඡා 2017 වසරේදී පැවැත්විණි. දෙපාර්ශවය විසින් භාණ්ඩ වෙළඳාම, සේවා වෙළඳාම, ආයෝජනය, ආර්ථික හා තාක්ෂණික සහයෝගීතාවය, වෙළඳ ප්‍රභව රීති, රේගු ක්‍රියා පටිපාටි සහ වෙළඳ පහසුකරණය, වෙළඳාම පිළිබඳ බාධක, සනීපාරක්ෂක හා ස්වස්ථතා මිනුම් සහ වෙළඳ ප්‍රතිකර්ම යන අංශයන්ට අදාළ ගැටළු පිළිබඳව අදහස් හුවමාරු කර ගන්නා ලදී.

2018 වර්ෂයේදී වෙළඳ සාකච්ඡා පවත්වනු නොලැබුවද චීන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි ඉදිරි ගමන පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළඳ අමාත්‍යාංශයෙහි සහභාගීත්වය සහිතව ජාතික වෙළඳ සාකච්ඡා කමිටු රැස්වීමේදී අභ්‍යන්තර සාකච්ඡා පවත්වා තිබේ.

**2.2.1.9 යෝජිත ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම**

ගරු අග්‍රාමාත්‍යවරයාගේ තායිලන්ත සංචාරයේදී ජූලි 12 වන දින පැවති ශ්‍රී ලංකා තායිලන්ත රාජ්‍ය නායකයන් විසින් පැවැත්වූ වෙළඳ සාකච්ඡාවලින් අනතුරුව, ශ්‍රී ලංකාව සහ තායිලන්තය අතර නිදහස් වෙළඳ ගිවිසුම පිළිබඳව පළමු වටයේ සාකච්ඡා 2018 ජූලි 13 වන දින කොළඹදී පැවැත්විණි. එහිදී දෙපාර්ශවයම ක්‍රියාකාරී කණ්ඩායම් 09කින් සැදී ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි අකෘතිය, ක්‍රියාකාරී කණ්ඩායම්වල විෂය පථය සහ ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුමෙහි රැස්වීම් සඳහා වැඩසටහන සම්බන්ධයෙන් එකඟ විය. එමෙන්ම, සාකච්ඡා වටයන්හි දෙවන වාරයට පෙර ඉදිරි සාකච්ඡාවටවලදී තීරුබදු අඩු කිරීමේ ආකෘති/ මාදිලි සම්බන්ධ පදනමක් සැපයීම පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා භාණ්ඩ ආනයන මත දැනට පනවා ඇති තීරුබදු සහ ගාස්තු, ආනයන හා අපනයන පිළිබඳ දත්ත, තීරුබදු නොවන මිනුම් සහ එක් එක් තීරුබදු කේත (කෝටා / බලපත්‍ර) මත අදාළ කරගත හැකි වෙළඳ ප්‍රතිපත්තිය සම්බන්ධයෙන් තොරතුරු හුවමාරු කර ගැනීමටද එකඟ විය.

මෙම ගිවිසුම පිළිබඳව දෙවන වටයේ සාකච්ඡාවන් 2018 සැප්තැම්බර් 19-21 දිනවල තායිලන්තයේ බැංකොක් නුවරදී පැවැත්වූ අතර එහිදී සියළුම ක්‍රියාකාරී කණ්ඩායම් විසින් රේගු පටිපාටි, වෙළඳ පහසුකරණය සහ බුද්ධිමය දේපළ අයිතීන් හැර අනෙකුත් කරුණු සම්බන්ධයෙන් සාකච්ඡා කරන ලදී. එමෙන්ම, ශ්‍රී ලංකා - තායිලන්ත නිදහස් වෙළඳ ගිවිසුම මඟින් මෙරට ආර්ථිකය වෙත හිමිවන ප්‍රතිලාභ හඳුනාගැනීම සඳහාත් එකී ප්‍රතිලාභ උපරිමකරණය සඳහා භාවිතා කළ හැකි විවිධ ක්‍රියාදාම පිළිබඳ නිර්දේශයන් ලබා ගැනීම සඳහාත් මෙම වෙළඳ ගිවිසුම පිළිබඳව සාකාච්ඡාවන්ට සමාන්තරව වැඩිදුර ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන මෙන් අතිගරු ජනාධිපතිතුමාගේ නිරීක්ෂණ මත අමාත්‍ය මණ්ඩලය විසින් නියෝග කරන ලදී.

### 2.2.1.10 යෝජිත බංගලාදේශ - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම

2017 වසර තුළ ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර ද්වි පාර්ශ්වික වෙළඳාම ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 160 ඉක්ම වූ අතර, ශ්‍රී ලංකාව හා බංගලාදේශය අතර වෙළඳ ශේෂය ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 81ක් විය. එය මේ දක්වා අඛණ්ඩව වර්ධනය වෙමින් පවතින අතර ඒ හේතුවෙන් ශ්‍රී ලංකාවට හිතකර වෙළඳ අතිරික්තයක් ඇතිවී තිබේ. වෙළඳාමේ මෙකී තියුණු වර්ධනයත් සමඟම අපනයන භාණ්ඩ සංයුතියෙහි වෙනසක්ද ඇති වී තිබේ.

එමෙන්ම, දැනට ක්‍රියාත්මක ආසියා ශාන්තිකර ගිවිසුම දකුණු ආසියානු නිදහස් වෙළඳ ගිවිසුමෙහි දෙපාර්ශවයම විසින්, තීරුබදු අඩු කිරීම පිළිබඳව සුවිශේෂී ආවරණයක් සම්බන්ධයෙන් ගිවිසුම් ගත වුවද, ඒ සම්බන්ධයෙන් දෙරට සඳහාම පවතිනුයේ ඌණ භාවිතයක් බව අවධානයට ලක් වී තිබේ. එබැවින්, මෙම යෝජිත ශ්‍රී ලංකා - බංගලාදේශ ගිවිසුම සම්බන්ධයෙන් ශක්‍යතා අධ්‍යනයක් සිදු කිරිම මෙන්ම, ඕනෑම වෙළඳ ගිවිසුමක් පිළිබඳව සාකච්ඡාවන්ට එළඹීමේදී එම වෙළඳ ගිවිසුම් මඟින් ඇති කළ හැකි සහයෝගීතාව කෙබඳු දැයි හඳුනා ගැනීම සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යනයක් සිදුකිරීම අවශ්‍ය වේ.

දෙරට අතර, ද්වි පාර්ශ්වික වෙළඳ හා ආර්ථික සබඳතා සවිබල ගැන්වීම සඳහා ආර්ථික හවුල්කාරීත්වය පිළිබඳ අවබෝධතා ගිවිසුම 2017 ජූලි 14 වැනි දින බංග්ලාදේශයේ ඪකා නුවර දී අත්සන් තැබිණි.

දෙපාර්ශවය විසින්ම එකඟ වූ කරුණු පිළිබඳ වගු මත පදනම් ව දෙපාර්ශවය විසින් ම ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යනය ආරම්භ කොට ඇත. මෙම ඒකාබද්ධ ශක්‍යතා අධ්‍යනය 2019 පෙබරවාරි මාසය ඇතුලත නිම කරනු ලබන අතර එහි වාර්තාව 2019 මාර්තු මාසයේදී ඉදිරිපත් කරනු ඇත.

### 2.2.2 නිදහස් වෙළඳ ගිවිසුම යටතේ ජාත්‍යන්තර වෙළඳාම

වෙළඳ ගිවිසුම් යටතේ 2018 වර්ෂය සඳහා ශ්‍රී ලංකාවේ වෙළඳ දත්ත වගුව 2.6 මඟින් දැක්වේ.

**වගුව 2.6. 2018 වර්ෂය තුල වෙළඳ ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවේ ආනයන / අපනයන පිලිබඳ තොරතුරු**

| අංකය | වෙළඳ ගිවිසුම | ආනයන වටිනාකම (රු.මි.) | අපනයන වටිනාකම (රු.මි.) |
|---|---|---|---|
| 1. | ඉන්දියා - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) | 41,273 | 81,929 |
| 2. | පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම ( PSFTA) | 12,062 | 8,772 |
| 3. | දකුණු ආසියා නිදහස් වෙළඳ ගිවිසුම | 1,215 | 9,237 |
| 4. | ආසියා - ශාන්තිකර වෙළඳ ගිවිසුම | 3,076 | 108,018 |
| | **එකතුව** | **57,626** | **207,956** |

මූලාශ්‍රය : - ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව , 2018

## 2.3 වෙළඳාම් පහසුකරණය

වෙළඳ ක්‍රියාපටිපාටි සහ ලිපි ලේඛන සරල කිරීම, වෙළඳ භාවිතයන් සහ රීති සමායෝජනය ජාත්‍යන්තර ප්‍රවාහ පිළිබඳව විනිවිදභාවයෙන් යුතු ක්‍රියාපටිපාටි ජාත්‍යන්තර වෙළඳාම ප්‍රවර්ධනය කිරීම සඳහා නව තාක්ෂණික සහාය ලබා ගැනීම සහ ජාත්‍යන්තර වාණිජ කටයුතු සඳහා වඩාත් සුරක්ෂිත ගෙවීම් මාධ්‍යය භාවිතය යන මූලික ලක්ෂණ 05 වෙළඳ පහසුකරණට ඇතුලත් වේ. වෙළඳ පහසුකරණයෙහි ඉලක්ක වනුයේ වෙළඳ ගනුදෙනු වඩා පහසු හා කාර්යක්ෂම සහ අඩු පිරිවැයක් සහිත බවට පත්කොට එමඟින් වෙළඳ ප්‍රවාහ පහසුකරණය ඇති කිරීමයි.

භාණ්ඩ හා සේවාවන්හි ආනයනය සහ අපනයන වඩා පහසුවට පත් කිරීම ඔස්සේ වෙළඳාම පහසුකරණ මිනුම් මඟින් ඍජු විදේශ ආයෝජන සඳහා සංවර්ධනය වෙමින් පවතින රටවල පවතින ආකර්ශනීයත්වය ද ඉහළ නංවනු ලැබේ. ගෝලීය අගය දාමයන් මත දැඩිව බැඳී පවතින ගෝලීය ආර්ථික පද්ධතියක් තුළ දේශ සීමා අතර වෙළඳාම පහසුකරණය යනු ඉතා වැදගත් කාරණාවකි.

ලෝක වෙළඳ සංවිධානයෙහි වෙළඳ පහසුකරණ ගිවිසුම මඟින් රේගු පටිපාටි විධිමත් කිරීම, සමායෝජනය සහ නව්‍යකරණය කිරීම අරමුණු කෙරේ. සංක්‍රමණ භාණ්ඩ ද ඇතුළත්ව භාණ්ඩ නිදහස් කිරීම සහ නිශ්කාෂණය කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීම සඳහා විධි විධාන මෙම ගිවිසුමට ඇතුලත් වේ. එමෙන්ම අන්තර් දේශ සීමා වෙළඳාම තුළ අදාළ අධිකාරයන් අතර සඵලදායක සහයෝගීතාවය සඳහා වන මිනුම් කිපයක් ඊට ඇතුලත්ය. වෙළඳාම් පහසුකරණ ගිවිසුම් මඟින් විනිවිදභාවය වැඩිදියුණු කිරීම, ගෝලීය අගය දාම හා සම්බන්ධවීමට ඇති හැකියාව ඉහළ නැංවීම සහ ප්‍රමාදයන් සහ බාධාවන් ඇතිවීමේ අවස්ථා අවම කර ගැනීම සඳහා ද සහාය ලැබෙනු ඇත.

වෙළඳ පහසුකරණ ගිවිසුම කොටස් තුනකින් සමන්විත වේ. පළමු කොටස මඟින් විවිධ වගන්තීන් 12ක් සහ සංක්‍රමණික භාණ්ඩද ඇතුළත්ව භාණ්ඩ සංචලනය, නිදහස් කිරීම හා නිෂ්කාශනය පිළිබඳව විධිවිධානද ඇතුලත් වේ. වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි විධිවිධාන ක්‍රියාත්මක කිරීමේදී සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ ඌන සංවර්ධිත රටවල් විසින් මුහුණ පෑ හැකි ගැටළු පිළිබඳව වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි දෙවන කොටස මඟින් හඳුන්වාදෙනු ලබන අතර, ඒ සම්බන්ධයෙන් සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ ඌන සංවර්ධිත රටවල් සඳහා විශේෂ සහ එකිනෙකට වෙනස් ක්‍රමවේද දක්වා ඇත. තම රටවල වෙළඳ බැඳීම් ක්‍රියාත්මක කිරීමත් ඒ

සම්බන්ධයෙන් A, B සහ C යන වර්ගීකරණ යටතේ ලෝක වෙළඳ සංවිධානය වෙත දැනුම් දීමත් සිදු කළ යුතු දිනය තීරණය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවතින සියලු රටවලට ඉඩ සැලසේ. ලෝක වෙළඳ සංවිධානය තුළ ක්‍රියාත්මක වන වෙළඳ පිළිබඳ ස්ථාවර කමිටුවත්, ලෝක වෙළඳ සංවිධානයට අයත් සාමාජික රටවල් විසින් වෙළඳ ගිවිසුම් පිළිබඳව දේශීය සම්බන්ධීකරණයත් තම රටවල් තුළ එම වෙළඳ ගිවිසුම් ක්‍රියාවට නැංවීමත් සඳහා පහසුකම් සැලසීම සඳහා ස්ථාපිත කරගත් ජාතික කමිටුවලටද දැන ගැනීම සඳහා වූ විධිවිධාන මෙම වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි තෙවන පරිච්ඡේදයට ඇතුළත් වේ.

රේගු නිරීක්ෂණය පිළිබඳ පටිපාටි ගණනාවකටම අදාළ විධිවිධාන කිහිපයක් වෙළඳ පහසුකරණ ගිවිසුමට ඇතුළත් වේ. ඒ සම්බන්ධයෙන් වෙළඳ ගිවිසුම මඟින් ආවරණය කරනු ලබන ප්‍රධාන අංශයන් වනුයේ, (1) රේගු නිෂ්කාශනට අදාළව නීති ප්‍රකාශනයට / ප්‍රසිද්ධියට පත් කිරීම පිළිබඳ ආචාර ධර්ම (2) උසස් රීති සඳහා විධිවිධාන (3) ගාස්තු සහ දඩ මුදල් අය කිරීම පිළිබඳ පිළිගත් ක්‍රමවේද (4) භාණ්ඩ පූර්වයන් පැමිණීමේ ක්‍රියාවලිය (5) විද්‍යුත් ගෙවීම් ක්‍රම භාවිතය (6) භාණ්ඩ සීඝ්‍රයෙන් නිදහස් කිරීම සඳහා ඇපකර (7) බලයලත් ක්‍රියාකරු ක්‍රමවේදය (8) නැව්ගත කිරීම කඩිනම් කිරීමේ පටිපාටි (9) ඉක්මණින් නරක් වන  භාණ්ඩ ඉක්මනින් නිදහස් කිරීම (10) පොදු රේගු සම්මතයන්ට අදාළව ලේඛන සහ නියාමනය අවම කිරීම (11) තනි කවුළුවක් භාවිතා කිරීම ප්‍රවර්ධනය කිරීම (12) දේශ සීමා පිළිබඳ ක්‍රියාවලීන්වල සමානතාව (13) භාණ්ඩ තාවකාලිකව ඇතුලත් කිරීම (14) භාණ්ඩ හුවමාරු කිරීම පිළිබඳව සරල ක්‍රමවේද (15) රේගු සහයෝගීතාව සහ සම්බන්ධීකරණය පිළිබඳ විධිවිධාන ඇතුළත් වේ.

රැකියා උත්පාදනය කිරීම සහ අපේක්ෂිත ආර්ථික සංවර්ධනය අත්කර ගැනීමේ අරමුණින් යුතුව, රජය වෙළඳ පහසුකරණය සඳහා ගතහැකි පියවර වැඩිදියුණු කිරීම සඳහා වෙළඳ පහසුකරණ ගිවිසුමට අනුකූලව ප්‍රමුඛතාව ලබා දී ඇත. ඒ යටතේ ලෝක වෙළඳ සංවිධානයේ බැඳීම් පහසුකරණ  ගිවිසුම මඟින් බැඳී ඇති  විධිවිධාන ක්‍රියාවට නැංවීම සඳහාද දේශීය සම්බන්ධීකරණය ඇති කිරීම සඳහාද 2016 වසරේදී ජාතික වෙළඳ පහසුකරණ කමිටුව(NTFC) ස්ථාපිත කරන ලදී.

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල්ගේ සභාපතිත්වයෙන්ද, ශ්‍රී ලංකා වාණිජ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ  සම සභාපතිත්වයෙන්ද සැදුම්ලත් ජාතික වෙළඳ පහසුකරණ කමිටුව රාජ්‍ය අංශය දේශසීමා නියාමනය සහ පෞද්ගලික අංශය නියෝජනය කරනු ලබන සමාජිකයන් 23 දෙනෙකුගෙන් සමන්විත කමිටුවකි. (දේශ සීමා නියාමන නියෝජිත ආයතන නියෝජනය කරනු ලබන සාමාජිකයන් 16 ක් සහ ශ්‍රී ලංකා වාණිජ මණ්ඩලයෙහි සාමාජිකයන් 07 ක්) මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරමින්, එහි වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ ජාතික වෙළඳ පහසුකරණ කමිටුවට ඇතුළත් වේ. ශ්‍රී ලංකාව තුළ වෙළඳ පහසුකරණය පිළිබඳ සම්බන්ධීකරණය සහ එය ක්‍රියාවට නැංවීම මෙන්ම වෙනත් ආකාර වෙළඳ පහසුකරණ ක්‍රියාකාරකම්වල සඵලදායක බව සහතික කිරීම සඳහා ලෝක බැංකු කණ්ඩායම් සහාය / ආධාර ඇතිව, ජාතික වෙළඳ පහසුකරණ කමිටුව සඳහා ලේකම් කාර්යාලයක්ද ස්ථාපිත කොට ඇත.

ජාතික වෙළඳ පහසුකරණ කමිටුවෙහි ලේකම් කාර්යාලය විසින් අදාළ සියලුම දේශ සීමා නියාමන නියෝජිත ආයතනවල සහාය ඇතිව, වෙළඳ පහසුකරණ ගිවිසුම සඳහා සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්මක් සකස් කරන ලදී. මෙම සැලසුම් ලේඛනයට, සංයුක්ත සැලසුමක් මෙන්ම, ජාතික වෙළඳ පහසුකරණ කමිටුවෙහි ක්‍රියාවට නැංවීමේ එක් එක් සියළුම නියෝජිත ආයතන සඳහා විශේෂයෙන් සකස් කරන ලද සැලසුම් අන්තර්ගත වේ. මෙම ක්‍රියාකාරී සැලසුමෙහි නිර්දේශ / ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබා දී ඇති අතර, ඒවා එකිනෙක අනුපිළිවෙලට

ක්‍රියාත්මක කිරීම සඳහා පෙළ ගස්වා තිබේ. ක්‍රියාකාරී සැලසුමෙහි කාලය වසර 05ක් සඳහාය (2018 - 2022). මෙම සැලසුම සඳහා සහාය ලබා දෙන ලද්දේ ලෝක බැංකු කණ්ඩායම සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානයයි.

ශ්‍රී ලංකාව, ලෝක වෙළඳ සංවිධානයෙහි A, B සහ C කාණ්ඩ යටතේ සිය වෙළඳ පහසුකරණ ගිවිසුම් ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සැකසීමේ කටයුතු අවසන් කොට ඇති අතර, එය දැනටමත් ලෝක වෙළඳ සංවිධානය වෙත භාරදී ඇත. ගිවිසුම බලාත්මක කරනු ලබන විට සාමාජික රට විසින් ක්‍රියාවට නංවනු ලබන විධිවිධාන A කාණ්ඩයට ඇතුළත් වේ. B කාණ්ඩයට අයත් වන්නේ ගිවිසුම බලාත්මක කළ පසු එය ක්‍රියාවට නැංවීමෙන් අනතුරුව සාමාජික රට විසින් ක්‍රියාවට නංවනු ලබන විධිවිධානයන්ය. ගිවිසුම බලාත්මක වීමෙන් පසුව සහ එය ක්‍රියාවට නැංවීමෙන් මද කලකට පසු දිනයක සාමාජික රට විසින් ක්‍රියාත්මක කරනු ලබන සහ ශක්‍යතාව ගොඩනැංවීම සම්බන්ධයෙන් සහාය ලබා ගත යුතු විධිවිධාන C කාණ්ඩයට ඇතුළත් වේ. වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි B සහ C කාණ්ඩ යටතේ ශ්‍රී ලංකාවේ වෙළඳ බැඳීම් ක්‍රියාවට නැංවීම සඳහා තාක්ෂණික සහාය සහ ශක්‍යතා වර්ධනය කිරීමේ සහාය ලෝක බැංකු කණ්ඩායම සහ ජාත්‍යන්තර වෙළඳ මධ්‍යස්ථානය මඟින් පිරිනැමේ.

ජාතික තනි කවුළුව (National Single Window) සහ වෙළඳ තොරතුරු ද්වාරය (Trade Information Portal – TIP) වශයෙන් වෙළඳ පහසුකරණ ගිවිසුමෙහි මූලික ප්‍රමුඛතා දෙකකි. 2018 වර්ෂයේ ජූලි මස ස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා වෙළඳ තොරතුරු ද්වාරය යනු ලංකාවේ ආනයන අපනයන පිළිබඳ සියළු තොරතුරු සඳහා ඒකීය නැවතුම්පොල දත්ත පද්ධතියකි. මුදල් අමාත්‍යාංශය ඇතුළු ශ්‍රී ලංකාවේ ආනයන අපනයන ක්‍රියාවලිය හා සම්බන්ධ සියලුම රාජ්‍ය හා අර්ධ රාජ්‍ය ආයතන වෙනුවෙන් වාණිජ දෙපාර්තමේන්තුව විසින් මෙම දත්ත පද්ධතිය නඩත්තු කරනු ලබයි.

මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි www.treasury.gov.lk, ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවට අයත් www.customs.gov.lk සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට අයත් www.documents.gov.lk යන වෙබ් අඩවිවල පළකොට ඇති යාවත්කාලීන කරන ලද තීරුබදු / බදු පිළිබඳව සවිස්තරාත්මක තොරතුරු ඉහත සඳහන් වෙළඳ තොරතුරු ද්වාරය ඔස්සේ ලබා ගත හැකිය.

එමෙන්ම, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය දේශ සීමා අතර වෙළඳාම පහසුකරණය සැලසීම සම්බන්ධයෙන් ගන්නා ලද ප්‍රතිපත්තිමය තීරණ දැනුම් දීමද ඒවා ක්‍රියාවට නැංවීමේදී සිදුකර ඇති අතර, 2018 වසරේ අයවැය යෝජනා යටතේ වෙළඳ පහසුකරණය සම්බන්ධයෙන් වූ යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියද පහත දක්වා ඇත.

**(අ) වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ පියවර / ප්‍රමිති ක්‍රියාවට නැංවීම**

2018 අයවැය යෝජනා අංක 19 සහ තාක්ෂණික සටහන් අංක 15 සහ 16 අනුව මෙම යෝජනාව ක්‍රියාවට නංවා ඇත.

යෝජනා අංක 19 - වාහන ආනයනයට අදාළ පූර්ව නැව්ගත කිරීමේ සහතික සංශෝධනයන්ද සමඟ වාහන වායු විමෝචන ප්‍රමිතීන් සහ ආරක්ෂණ ප්‍රමිතීන්ද හඳුන්වා දෙනු ඇත.

තාක්ෂණික සටහන් අංක 15 - සෞඛ්‍ය සහ පාරිසරික ආරක්ෂණ වැඩපිළිවෙළට සමගාමීව යූරෝ - 4 ට අඩු අගයකින් යුතු හෝ ඊට සමාන අගයකින් යුතු වායු විමෝචනය සහිත රථ වාහන ආනයන 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනම් කරනු ඇත.

තාක්ෂණික සටහන් අංක 16 - මගීන්ගේ ආරක්ෂාව පිළිබඳ මිනුම්වලට සමගාමීව (1) රියදුරු සහ ඉදිරි අසුනේ ගමන් ගන්නා මගීන් සඳහා වායු බෑග (Air Bags) සහිත වීම (2) තිරිංග යෙදීමේදී රෝද ලිස්සා යාම වලක්වන තිරිංග පද්ධතිය (ABS) සහිත වීම සහ (3) රියදුරු, ඉදිරිපස අසුන් සහ පසුපස ආසනවල ගමන් ගන්නා මගීන් සඳහා තුන් කොන් ආසන පටි (Seat belts) සහිත වීම යන ආරක්ෂණ සම්මතයන් සපුරා නොමැති වාහන ආනයන 2018 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි තහනම් කෙරෙනු ඇත.

ඒ අනුව, වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව වාහන වායු විමෝචන ප්‍රමිති සහ ආරක්ෂණ ප්‍රමිති ක්‍රියාවට නැංවීම පිළිබඳ නීති/රෙගුලාසි සකස් කොට අවසන් කිරීම සඳහා අදාළ පාර්ශවයන් සමඟ රැස්වීම් ගණනාවක් පවත්වා තිබේ. ඉන් පසුව, අදාළ සංයෝජිත වර්ගීකරණ පිළිබඳ තොරතුරුද ඇතුළත්ව නව නීති රෙගුලාසි පිළිබඳව මහජනයා දැනුවත් කිරීම සඳහා පුවත්පත් නිවේදන කිහිපයක්ම මුදල් අමාත්‍යාංශය මඟින් නිකුත් කරන ලදී. මෙම නීති රෙගුලාසි ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ පාර්ශවයන් විසින් මෙහෙයුම් උපදෙස් දෙකක් සහ ගැසට් නිවේදන හතරක් ප්‍රකාශයට පත් කරන ලදී.

- මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද 2018 ජූලි 12 දිනැති අංක 2079/42 සහ 2018 අගෝස්තු 06 දිනැති අංක 2083/03 දරන ගැසට් පත්‍ර
- ආනයන සහ අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2018 ජූලි 13 දිනැති අංක 2079/70 සහ 2018 අගෝස්තු 10 දිනැති අංක 2083/37 දරන ගැසට් පත්‍ර

**(ආ) ඖෂධ වර්ග පිළිබඳ මහා පරිමාණ ආයෝජන, කිරි නිෂ්පාදනය ආශ්‍රිත කර්මාන්ත සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ ව්‍යාපාර කටයුතු සඳහා බන්ධිත පහසුකම් සැලසීම**

2018 අයවැය කථාවෙහි යෝජනා අංක 99 - ඖෂධ වර්ග පිළිබඳ මහා පරිමාණ ආයෝජන, කිරි නිෂ්පාදනය ආශ්‍රිත කර්මාන්ත සහ ඝන අපද්‍රව්‍ය කළමනාකරණයට අදාළ ව්‍යාපාර කටයුතු ආශ්‍රිත ඉදිකිරීම් කාලය අතරතුර ව්‍යාපාරවලට අදාළව ආනයනය කරන ලද ප්‍රාග්ධන භාණ්ඩ සඳහා බන්ධිත පහසුකම් ලබා දීම තුළින් බදු සහන ලබා දීම

ඒ අනුව, ඖෂධ ද්‍රව්‍ය වෙළඳාම, කිරි නිෂ්පාදන, ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සහ පුනර්ජනනීය බලශක්ති අංශයන් සඳහා බන්ධිත පහසුකම් ලබා දිම පිළිබඳව නීති / රෙගුලාසි සකස් කොට අවසන් කිරීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශවකරුවන් සමඟ රැස්වීම් කිහිපයක් පවත්වන්නට යෙදුනි. ඉන්පසුව මෙම අයවැය යෝජනාව ක්‍රියාවට නැංවීම සඳහා 2018 අගෝස්තු 10 දිනැති අංක 2088/33 දරණ ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කරන ලදී.

**(ඇ) ව්‍යාපාරයෙන් පාරිභෝගිකයා වෙත විද්‍යුත් භාණ්ඩ වෙළඳාම (E – Commerce) සඳහා පහසුම් සැලසීම**

2018 අයවැය කථාවෙහි යෝජනා අංක 95 - ව්‍යාපාරයෙන් පාරිභෝගිකයා වෙත (B to C) විද්‍යුත් වාණිජ්‍ය ගනුදෙනු සඳහා පවතින ඉහළ යන ඉල්ලුම සපුරා ලීමටත් ඒ සම්බන්ධයෙන් පහසුකම් සැලසීමත් සඳහා ආයෝජන මණ්ඩලය සහ රේගු දෙපාර්තමේන්තුව විසින් 2018 ජනවාරි 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි එවැනි ගනුදෙනු සඳහා පටිපාටියක් සකස් කරනු ඇත.

ඒ අනුව, ව්‍යාපාරයෙන් පාරිභෝගිකයා වෙත විද්‍යුත් ගනුදෙනු සම්බන්ධයෙන් නීති රෙගුලාසි සකස් කිරීම සඳහා වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් අදාළ පාර්ශවකරුවන් සමඟ රැස්වීම් 12 ක් පවත්වා ඇති අතර 2018 ජූනි 29 දිනැති අංක 2077/46 දරණ ගැසට් පත්‍රය ද නිකුත් කර ඇත.

**(ඇ) මෝටර් රථ වාහන සම්බන්ධයෙන් ලබා දෙන ණය පහසුකම් සඳහා වටිනාකම සඳහා ණය අනුපාතිකය (Loan to Value Ratio – LTV)**

2018 අයවැය කථාවෙහි යෝජනා අංක 18 – විදුලි බස් රථ සහ ත්‍රී රෝද රථ සඳහා වටිනාකම සඳහා ණය අනුපාතිකය 90/10 දක්වා සංශෝධනය කරනු ඇත. එමෙන්ම, එම ණය අනුපාතිකය දේශීයව එකලස් කරන ලද විද්‍යුත් ත්‍රීරෝද රථ, කාර් රථ සහ බස් රථ සඳහා ද හිමිවනු ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ යුතු නියෝග ලබා දීම සඳහා එහි ඉල්ලීම මත, මෝටර් රථ වාහන සම්බන්ධයෙන් ලබා දෙන ණය පහසුකම් සඳහා වටිනාකම මත ණය අනුපාතික ක්‍රියාවට නැංවීම පිළිබඳ අයවැය යෝජනාවෙහි අරමුණ පිළිබඳව පැහැදිලි කිරීමක් මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දී ඇත.

මෙම යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා 2018 අංක 01 දරණ බැංකුකරණ පනත් විධාන (කලින් කලට මේ සඳහා සිදු කෙරෙන සංශෝධන ද ඇතුළත්ව) නිකුත් කරන ලදී.

## 2.4. ආනයන තීරුබදු ව්‍යුහය

2.7 වගුව - 2018 දෙසැම්බර් 31 වැනි දිනට තීරු බදු ව්‍යුහය

| අංකය | තීරුබදු අනුපාතය | තීරුබදු සංකේතාංක සංඛ්‍යාව (සංයෝජිත වර්ගීකරණය 2017 - සංඛ්‍යාංක 08 ක් වන ) | ප්‍රතිශතය |
|---|---|---|---|
| 1 | නිදහස් | 4,064 | 54.5 |
| 2 | 5% | 2 | 0.0 |
| 3 | 10% | 9 | 0.1 |
| 4 | 15% | 1,542 | 20.7 |
| 5 | 25% | 25 | 0.3 |
| 6 | 30% | 1,459 | 19.6 |
| 7 | 75% | 03 | 0.0 |
| 8 | 85% | 00 | 0.00 |
| 9 | 125% | 05 | 0.1 |
| 10 | විශේෂිත අනුපාත | 76 | 1.0 |
| 11 | විශේෂිත අනුපාත සහ වටිනාකම මත අය කරන ලද අනුපාත | 275 | 3.7 |
| **එකතුව** | | **7,460** | **100.00** |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

**2.8 වගුව - 2011 සිට 2018 දක්වා තීරු බදු ව්‍යුහයේ වෙනස්කම්**

| අංකය | තීරුබදු කාණ්ඩය | තීරුබදු සංකේතාංක (සංඛ්‍යාංක 08) | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | **2018** | **2017** | **2016** | **2015** | **2014** | **2013** | **2012** | **2011** |
| 1 | නිදහස් | 4,064 | 4,064 | 3,938 | 3,922 | 3,410 | 3,379 | 3,024 | 3,024 |
| 2 | 2.5% | | | | | | | | |
| 3 | 5% | 2 | 2 | 2 | | | | 410 | 412 |
| 4 | 6% | | | | | | | | |
| 5 | 7.5% | | | | | 188 | 184 | | |
| 6 | 10% | 9 | 9 | 9 | | | | | |
| 7 | 15% | 1,542 | 1,534 | 1,309 | 1,324 | 1,601 | 1,590 | 1,587 | 1,508 |
| 8 | 25% | 25 | 25 | 25 | | 1,450 | 1,415 | | |
| 9 | 28% | | | | | | | | |
| 10 | 30% | 1,459 | 1,454 | 1,430 | 1,457 | | | 1,504 | 1,323 |
| 11 | සුඛෝපභෝගී අනුපාත | 8 | 9 | 9 | 9 | 9 | 9 | 9 | 9 |
| 12 | විශේෂ අනුපාත / ඒකක අනුපාත | 76 | 72 | 65 | 67 | 84 | 84 | 84 | 77 |
| 13 | විශේෂිත අනුපාත සහ වටිනාකම මත අය කරන ලද අනුපාත | 275 | 269 | 255 | 186 | 184 | 183 | 200 | 162 |
| **එකතුව** | | **7,460** | **7,438** | **7,042** | **6,965** | **6,926** | **6,844** | **6,818** | **6,515** |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

## 2.4.1. 2018 වසරේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට අලුතින් එකතු කරන ලද ජාතික උප බෙදීම් සංකේතාංක

වෙළඳාම, ආයෝජන සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීමට 2018 වසරේදී පහත වගුවේ දැක්වෙන පරිදි නව ජාතික උප බෙදීම් සංකේතාංක 32ක් දේශීය වශයෙන් සකස් කරන ලදී.

**2.9 වගුව - 2018 වර්ෂයේදී සංයෝජිත වර්ගීකරණ පද්ධතියට ඇතුළත් කරන ලද නව ජාතික උප බෙදීම්**

| අංකය | සංයෝජිත වර්ගීකරණ සංකේතාංක | විස්තරය |
|---|---|---|
| 1 | 05119140 | මත්ස්‍යයන් ඇල්ලීමේ ඇම වශයෙන් භාවිතා කිරීම සඳහා ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය විසින් සහතික කරනු ලැබූ මිනිසුන්ගේ පරිභෝජනය සඳහා නුසුදුසු කුඩා ශරීර සහිත ඇම සඳහා භාවිතා කරන ශීර්ෂපාදික මොලුස්කාවන්, දැල්ලන් සහ ක්ෂීර මත්ස්‍යයන් |
| 2 | 22029951 | මිලි ලීටර් 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් |
| 3 | 22029959 | වෙනත් |
| 4 | 22029961 | මිලි ලීටර් 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් |
| 5 | 22029969 | වෙනත් |
| 6 | 22029970 | ධාන්‍ය හෝ ගස්වල හටගන්නා කට්ට සහිත ගෙඩි, ඇට පාදක කරගත් පානයන් |
| 7 | 22029991 | මිලි ලීටර් 100ක අන්තර්ගත සීනි ප්‍රමාණය ග්‍රෑම් 6ට වඩා වැඩි පානයන් |
| 8 | 22029999 | වෙනත් |
| 9 | 27101221 | ඔක්ටේන් අංක 92 සහිත පෙට්‍රල් |
| 10 | 27101222 | ඔක්ටේන් අංක 95 සහිත පෙට්‍රල් |
| 11 | 27101229 | වෙනත් |
| 12 | 27101941 | කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට නොවැඩි ගෙන්දගම් අඩංගු සුපිරි ඩීසල් |
| 13 | 27101942 | කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 10ට වැඩි නමුත් කිලෝග්‍රෑම් 1කට මිලිග්‍රෑම් (මිලියන එකකට කොටස්) 500ට නොවැඩි ගෙන්දගම් අඩංගු අනෙකුත් ඩීසල් වර්ග |
| 14 | 27101949 | වෙනත් |
| 15 | 38231920 | පාම්තෙල් මේද අම්ල |
| 16 | 38231930 | ටැලෝ මේද අම්ල |
| 17 | 39205191 | ඝනකම මිලිමීටර් 100 නොඉක්මවූ |
| 18 | 39205199 | වෙනත් |
| 19 | 39206311 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවහායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 20 | 39206319 | වෙනත් |
| 21 | 39206391 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවහායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 22 | 39206399 | වෙනත් |
| 23 | 39206911 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද |

| | | |
|---|---|---|
| | | ජෛවභායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 24 | 39206919 | වෙනත් |
| 25 | 39206991 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවභායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 26 | 39206999 | වෙනත් |
| 27 | 39231050 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවභායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 28 | 39232930 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවභායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 29 | 39241010 | මධ්‍යම පරිසර අධිකාරිය සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය අනුමත කරන ලද ජෛවභායනයට ලක්වන හා දිරාපත්වන ප්ලාස්ටික් |
| 30 | 39241090 | අනෙකුත් ප්ලාස්ටික් වලින් |
| 31 | 65050010 | පෝරු දැමූ හෝ නොදැමූ හෝ හැඩ ඇල්ලූ, නොඇල්ලූ හෝ කුමන ද්‍රව්‍යකින් හෝ නිමකළ කොණ්ඩා දැල් |
| 32 | 65050090 | වෙනත් |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

### 2.4.2. 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත යටතේ සිදුකළ සංශෝධන

1962 අංක 19 දරණ ආදායම් සංරක්ෂණ පනත යටතේ පළ කරන ලද ආදායම් සංරක්ෂණ ආඥා නියෝග පිළිබඳ විස්තර පහත දැක්වෙන වගුවෙහි සඳහන් කර ඇත. වෙළඳාම සහ කර්මාන්ත සඳහා පහසුකම් සැලසීම සඳහා 2018 වසරේදී එවැනි ආඥා නියෝගයන 09ක් නිකුත් කර ඇත.

**2.10** වගුව **- 1962** අංක **19** දරන ආදායම් සංරක්ෂණ ආඥා පනත *(රේගු තීරු බදු වෙනස්වීම්)*

| අංකය | ආදායම් සංරක්ෂණ ආඥාව පිළිබඳ විස්තර | ගැසට් පත්‍රයේ දිනය සහ අංකය | බලාත්මක කරන ලද දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | RPO/01/2018 | 2062/45 – 2018.03.16 | 2018.03.17 | ආසියා ශාන්තිකර වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු සහන ලබා දීමේ 4 වන වටය ක්‍රියාත්මක කිරීම සම්බන්ධව 2018.01.30 දිනැති අංක 18/009/719/002 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා ලද අමාත්‍ය මණ්ඩල අනුමැතිය මත එකී වෙළඳ ගිවිසුමෙහි සහන ලබා දීමේ 4 වන වටය යටතේ තෝරාගත් ආනයන කරනු ලබන භාණ්ඩ (සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 154ක්) සඳහා තීරුබදු සංශෝධනය කිරීම මෙම ගැසට් නිවේදනය යටතේ සිදු කොට ඇත.<br>ඊට අමතරව, මෙම ගැසට් නිවේදනය මගින් විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා අවශ්‍ය වන ඇක්‍රිලික් පැනල, මත්ස්‍ය ඇම වශයෙන් භාවිතා කරන කුඩා මසුන්, හිසකේ සකසන දැල්, වියෝජනය කළ හැකි සහ දිරා යන ප්ලාස්ටික් ද්‍රව්‍ය සඳහා නව සංයෝජිත වර්ගීකරණ කේත සකස් කිරීමද කිරි දෙනුන්ගේ ආහාර සඳහා භාවිතා කරන ඇල්ෆාල්ෆා ශාක මත අයකරන 15% තීරු බද්ද ඉවත් කිරීමද, 30% ක බදු අනුපාතය වෙනුවට 30% ක් හෝ කිලෝග්‍රැමයට රු. 350/- ක් වශයෙන්ද, ආනයනය කරන ලද ලොතරැයි පත් සහ දුරකථන කාඩ් මත බදු පැනවීමද සිදු කොට ඇත. |
| 2 | RPO/02/2018 | 2067/2 – 2018.04.17 | 2018.04.18 | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වාර්තා කරන අන්දමට, 2018 වසරේදී රන් ආනයනය ඉතා විශාල වශයෙන් ඉහළ ගොස් ඇති අතර එය විනිමය අනුපාතය මත අහිතකර බලපෑමක් ඇති වීමටත් වෙනත් රටවල් වෙත අනවසර රත්රන් ප්‍රවාහනයටත් හේතු වී තිබේ. එබැවින් රන් ආනයනය මත 0% වූ බද්ද 15% දක්වා ඉහළ දැමීම සිදු කර ඇත. |

| | | | | |
|---|---|---|---|---|
| 3 | RPO/03/2018 | 2069/2 – 2018.05.01 | 2018.05.01 | අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද 2018.01.16 දිනැති අංක 18/0104/752/004 දරන අමාත්‍ය මණ්ඩල සංදේශයට අනුව, ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ සංයෝජිත වර්ගීකරණ කේත 3,719ක් සඳහා තීරුබදු ඉවත් කිරීම සඳහා අනුමැතිය හිමිවී ඇත. මෙම නියෝගය පල කිරීම තුළින් සංයෝජිත වර්ගීකරණ කේත 3,539කින් යුතු ලැයිස්තුව එනම් කේත 180ක් හැර ඉතිරි සංකේත වලින් හැඳින්වෙන භාණ්ඩ ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුම යටතේ තීරුබදු රහිත භාණ්ඩ වශයෙන් ප්‍රකාශයට පත් කර ඇත. |
| 4 | RPO/04/2018 | 2069/19 - 2018.05.02 | 2018.05.03 | වටිනාකම අඩුවෙන් තක්සේරු කර බීඩි කොළ සහ බීඩි දුම් කොළ ආනයනය කිරීම හේතුවෙන් රජයේ ආදායම කෙරෙහි ඇතිවන අලාභය සීමා කිරීමේ අරමුණින් 2018 මැයි 03 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ආනයන මත ප්‍රතිශතාත්මක පදනමට අමතරව බර මත පදනම් වෙමින් බීඩි කොළ සහ බීඩි දුම් කොළ මත රේගු තීරු බද්දක් පැනවීමට කටයුතු කර ඇත. |
| 5 | RPO/05/2018 | 2071/15 - 2018.05.15 | 2018.05.16 | දේශීය වෙළඳපොළේ ඉන්ධන මිල සූත්‍රය හඳුන්වා දීමත් සමඟ පෙට්‍රල් සඳහා ඔක්ටේන් 92 සහ ඔක්ටේන් 95 කාණ්ඩ දෙක යටතේ ද ඩීසල් සඳහා සුපර් ඩීසල් සහ වෙනත් ඩීසල් වශයෙන්ද වෙන් වෙන් වශයෙන් ආනයන බදු හඳුන්වා දීමට තීරණය කරන ලදී. ඒ අනුව, මෙම ගැසට් නිවේදනය මඟින් 2018 මැයි 18 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්ධන මිළ සූත්‍රයට සමාන්තරව ඉන්ධන ආනයන තීරුබදු සංශෝධනය කිරීමටත් ඒ සඳහා අවශ්‍ය නව රේගු සංකේත ඇති කිරීමත් සිදු කරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 6 | RPO/06/2018 | 2079/32 - 2018.07.10 | 2018.07.11 | 2018 අයවැය යෝජනා පළතුරු යුෂ නිෂ්පාදනයෙහි නිරත දේශීය නිෂ්පාදකයන්ගේ ඉල්ලීම මත මිලිලීටර් 100ට ග්‍රෑම් 06කට වැඩි සංයුතියකින් යුතු පළතුරු බීම වර්ග (පළතුරු යුෂ නිෂ්පාදනයක අඩංගු විය යුතු සාමාන්‍ය ස්වභාවික සීනි ප්‍රතිශතය ලීටරයට ග්‍රෑම් 06කි) සඳහා නිෂ්පාදන බදු අය කිරීමට මඟින් නව සංයෝජිත වර්ගීකරණ කේතයක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම, දේශීය බීඩි නිපැයුම්කරුවන්ගේ නිෂ්පාදන පිරිවැය අඩු කරමින් ආනයනය කරන ලද බීඩි කොළ මත අය කරන ලද තීරුබදු ප්‍රතිශතය 30% හෝ කිලෝග්‍රෑමයට රු. 250/-ක් වශයෙන් 2018.05.03 දිනට පෙර පැවති අනුප්‍රමාණයන් සංශෝධනය කරන ලදී. |
| 7 | RPO/07/2018 | 2080/42 - 2018.07.19 | 2018.07.20 | ශ්‍රී ලංකා - සිංගප්පූරු නිදහස් වෙළඳ ගිවිසුමට අදාළ තීරුබදු ලිහිල්කරණ වැඩසටහන 2018 මැයි 01 දින සිට බලාත්මකව පවතින අතර එහිදී සංශෝධනයන්ට භාජනය වූ භාණ්ඩ වර්ග 182 ක් හැර, ඉතිරි භාණ්ඩ වර්ග සඳහා ආදායම් සංරක්ෂණ වාර්තාව නිකුත් කර ඇත. එකී ඉතිරිව පවතින භාණ්ඩ වර්ග 182 රේගු ආනයන බදුවලින් නිදහස් යන පදනම මත ඒ සඳහා වෙළඳපොළ ප්‍රවේශය ලබා දීමට මෙම ගැසට් නිවේදනය මඟින් කටයුතු කර ඇත. |
| 8 | RPO/08/2018 | 2092/8 - 2018.10.08 | 2018.10.09 | දේශීය සබන් කර්මාන්ත කරුවන්ට ආනයනික සබන් කර්මාන්තයේදී ඇති බදු බලපෑම සමාන තත්වයක් ඇති වන ලෙසට පාම්තෙල් (කටුපොල් තෙල්) මේද අම්ල, සත්ත්ව තෙල් මේද අම්ල සඳහා නව සංයෝජිත වර්ගීකරණ කේත හඳුන්වා දී ඇත. ඊට අමතරව, වැසිකිළි බඳුන් (squatting pans) ආනයනයේදී සිදුවිය හැකි ඌන තක්සේරුව හේතුවෙන් දේශීය නිෂ්පාදකයන් ආරක්ෂා කර ගැනීම සඳහා තීරුබදු සංශෝධනයක් සිදු කරන ලදී. |
| 9 | RPO/09/2018 | 2097/36 - 2018.11.15 | 2018.11.16 | රජයේ ආදායම රැස්කර ගැනීම සඳහා මිළ සූත්‍රයට අනුව පෙට්‍රල් සඳහා පවතින සිල්ලර මිළ සහ එහි ප්‍රතිපත්තිමය මිළ අතර පරතරය සැළකිල්ලට ගනිමින් පෙට්‍රල් සඳහා ආනයන තීරුබද්ද ලීටරයට රු. 35/- වශයෙන් සංශෝධනය කරන ලදී. |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

### 2.4.3 2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත

2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ නෛතික ප්‍රතිපාදන මත ගැසට් නිවේදනයක් පළ කිරීම මගින් බදු අය කිරීම සඳහා වූ තනි සංයුතියකින් යුතු විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත 2018 වසරේදීද තෝරාගත් ආනයන භාණ්ඩ කිහිපයක් සම්බන්ධයෙන් පනවා ඇත (උදා -අර්තාපල්, රතුළූණු සහ බී ළූණු වැනි). දේශීය ගොවියා සඳහා පහසුකම් සපයන අතර පාරිභෝගිකයින් සඳහා දැරිය හැකි මිළක් පවත්වාගෙන යාම සඳහා විධිමත් සංශෝධන මෙම පනත යටතේ සිදු කර ඇත. විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ අරමුණු ප්‍රවර්ධනය කිරීම සඳහා 2018 වසර තුළදී පහත වගුවෙහි දැක්වෙන පරිදි නියෝග 26ක් නිකුත් කොට ඇත.

**2.11** වගුව - **2007 අංක 48 දරණ විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත යටතේ සිදුකරන ලද බදු සංශෝධන**

| අංකය | ගැසට් අංකය හා දිනය | බලාත්මක දිනය | අයිතම | බදු සංශෝධන |
|---|---|---|---|---|
| 1 | 2054/40 2018.01.18 | 2018.01.19 | කුඩා කැබලි හෝ පිටි කළ වීස්, උම්බලකඩ, උඳු, මිරිස්, කොත්තමල්ලි, කහ, උඳු පිටි, ටින් මාළු | බේකරි කර්මාන්තයේ භාවිතය සඳහා පිටි හෝ කුඩු කරන ලද වීස් සඳහා සහනදායී බදු හඳුන්වා දුන් අතර අයිතම 7ක් සඳහා දැනට පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය ඉදිරි මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 2 | 2056/33 2018.01.31 | 2018.02.01 | බඩ ඉරිගු | ආර්ථික කළමනාකරණ පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටු තීරණය අනුව, සත්ව ආහාර නිෂ්පාදනයට පහසුකම් සැපයීම සඳහා බඩඉරිඟු ආනයනය මත කිලෝග්‍රෑමයට රු. 10/-ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් මාස 06ක කාලයක් සඳහා හඳුන්වා දෙන ලදී. 2018 ජනවාරි මස 31 වන දිනෙන් එය කල් ඉකුත් වී ඇත. එබැවින්, ජීවන වියදම් පිළිබඳ කමිටුව විසින් දේශීය නිෂ්පාදන වෙළඳපොළට පැමිණෙන තෙක් බඩ ඉරිගු ආනයනය තවත් මාසයකින් දීර්ඝ කිරීමට තීරණය කරන ලදී. |
| 3 | 2058/30 2018.02.15 | 2018.02.16 | සීනි | දේශීය වෙළෙඳපොළේ මිල ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් පවත්නා බදු අනුපාතයන්ගේ වලංගු කාල සීමාව මාස 6 ක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 4 | 2059/52 2018.02.23 | 2018.02.24 | අර්තාපල් | දේශීය නිෂ්පාදනය සැලකිල්ලට ගනිමින්, දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා මාසයක කාලයක් සඳහා අර්තාපල් ආනයනය මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |

| | | | | |
|---|---|---|---|---|
| | | | | කිලෝග්‍රෑමයට රු. 1/- සිට කිලෝග්‍රෑමයට රු. 30/- දක්වා වැඩි කරන ලදී. |
| 5 | 2061/22 2018.03.07 | 2018.03.08 | මැකරල් මාළු, පීස්, කඩල, කව්පි, කුරක්කන් | දේශීය ටින් මාළු කර්මාන්තය සහ දේශීය වෙළෙඳපොළේ මිල ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් පවත්නා බදු අනුපාතයන්ගේ වලංගු කාල සීමාව මාස 6 ක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 6 | 2063/13 2018.03.19 | 2018.03.20 | උඳු | දේශීය ගොවීන්ට සාධාරණ මිලක් සහතික කිරීම සඳහා උඳු ආනයනය මත බද්ද කිලෝග්‍රෑමයට රු. 60/- සිට කිලෝග්‍රෑමයට රු. 100/- දක්වා වැඩි කරන ලදී. |
| 7 | 2064/49 2018.04.01 | 2018.04.01 | අර්තාපල්, සහල්, යෝග ට්, බටර්, සුදුළූණු, දොඩම්, මිදි, ඇපල්, උළුහාල්, කුරක්කන් පිටි, රටකජු, අබ ඇට, ලූණු | ජීවන වියදම් කමිටුවේ නිර්දේශය මත, අර්තාපල් ආනයනය මත පවත්නා බදු අනුපාතයේ වලංගු කාලය මාස 03ක් සඳහා දීර්ඝ කර ඇති අතර, සහල් ආනයනය මත පවත්නා සහනදායි බදු අනුපාතයේ වලංගු කාලය දින 31 ක් සඳහා ද අනෙකුත් භාණ්ඩ ආනයනය සඳහා පවත්නා බදු අනුපාතයේ වලංගු කාලය මාස 6 ක් සඳහා ද දීර්ඝ කරන ලදී. |
| 8 | 2069/18 2018.05.01 | 2018.05.02 | අර්තාපල්, බී ළූණු | ජීවන වියදම් කමිටුවේ නිර්දේශය මත මෙන්ම වෙළෙඳපොළ මිල ගණන් සළකා බැලීමෙන් සහ දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා, අර්තාපල් ආනයනය මත බද්ද කිලෝග්‍රෑමයට රු. 30/- සිට කිලෝග්‍රෑමයට රු. 40/- දක්වාද බී ළූණු ආනයනය මත බද්ද කිලෝග්‍රෑමයට රු. 1/- සිට කිලෝග්‍රෑමයට රු. 40/- දක්වාද වැඩි කරන ලදී. |
| 9 | 2070/2 2018.05.08 | 2018.05.08 | මාළු, මුංඇට, මැංගුස්ටීන්, වියළන ලද දොඩම්, පෙයාර්ස්, චෙරි, වියළි මුද්දරප්පලම්, කිවි ෆෲට්, වෙනත් පළතුරු, හාල්මැස්සන්, කරවල | මෙම භාණ්ඩ වර්ග 11 සඳහා පවත්නා විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාලය තවත් මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |

| | | | | |
|---|---|---|---|---|
| 10 | 2070/6 2018.05.09 | 2018.05.09 | පරිප්පු | ජාත්‍යන්තර වෙළඳපොළ මිළ ගණන් සැළකිල්ලට ගනිමින්, පියලි නොකරන ලද පරිප්පු ආනයනය මත බද්ද රු. 1/- සිට රු. 7/- දක්වා සහ පියලි කරන ලද පරිප්පු ආනයනය මත බද්ද රු. 3/- සිට රු. 12/ දක්වා වැඩි කිරීමට ජීවන වියදම පිළිබඳ කැබිනට් අනු කමිටුව විසින් නිර්දේශ කරන ලදී. |
| 11 | 2071/85 2018.05.20 | 2018.05.21 | රතුළූණු, රටඉඳි, වියළි මිදි, සුදුරු, මහදුරු, මාගරින් | අයිතම 6ක් සඳහා දැනට පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාල සීමාව මාස 6 ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී |
| 12 | 2073/37 2018.05.31 | 2018.06.01 | එළවළු තෙල් | පසුගිය වසරට සාපේක්ෂව, පොල් සහ ආශ්‍රිත නිෂ්පාදනවල පවත්නා වෙළඳපොළ මිළ ස්ථාවරත්වය සැළකිල්ලට ගැනීමෙන් කිලෝග්‍රෑමයට රු. 20/- කින් මිළ වැඩි කරන ලදී |
| 13 | 2075/31 2018.06.14 | 2018.06.14 | තලපත්, කොප්පරා මසුන්, තෝරා මසුන්, පොල් මදය සහ උඳු | තෝරාගත් මාළු වර්ග සහ පොල් මදය සඳහා වලංගු කාලය දීර්ඝ කරන ලදී. ජීවන වියදම් කමිටුවේ තීරණය පිළිබඳව සලකා බැලීමෙන් දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා උඳු ආනයනය මත වූ බද්ද කිලෝග්‍රෑමයට රු. 100/- සිට කිලෝග්‍රෑමයට රු. 150/- දක්වා වැඩි කරන ලදී. |
| 14 | 2080/36 2018.07.18 | 2018.07.19 | කුඩා කැබලි හෝ පිටි කළ වීස්, උම්බලකඩ, මිරිස්, කොත්තමල්ලි, කහ, උඳු පිටි, ටින් මාළු | අයිතම 7ක් සඳහා දැනට පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්දෙහි වලංගු කාල සීමාව තවත් වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී |
| 15 | 2082/31 2018.08.01 | 2018.08.01 | සියලුම මාළු වර්ග | මාස දෙකක වලංගු කාලසීමාවක් සඳහා සෑම මත්ස්‍ය වර්ගයක් මතම වූ බදු අනුපාතය 10% හෝ කිලෝග්‍රෑමයකට රු. 100/- සිට රු. 25/- දක්වා අඩු කරන ලදී. අධිශීත තත්ත්වයෙන් ආනයනය කරනු ලබන මෙම මාළු වර්ග පරීක්ෂා කිරීමේදී විශේෂ වෙළඳ භාණ්ඩ බදු අනුපාත |

| | | | | |
|---|---|---|---|---|
| | | | | දෙකක් යටතේ පරීක්ෂා කිරීමේදී ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව විසින් මුහුණ දෙනු ලබන දුෂ්කරතාවයන් අවම කිරීම සඳහා මෙම තීරණය ගන්නා ලදී. |
| 16 | 2083/9<br>2018.08.08 | 2018.08.09 | බඩ ඉරිඟු | කෘෂිකර්ම අමාත්‍යාංශයේ නිර්දේශ සහිතව, සත්ව ආහාර සඳහා අවශ්‍ය අමතර බඩ ඉරිගු ඉල්ලුම සපුරා ගැනීම සඳහා මාස 06ක කාලයක් සඳහා බල පැවැත්වෙන පරිදි ආනයනය කරනු ලබන බඩ ඉරිගු කිලෝග්‍රෑමයක් සඳහා රු. 10/- ක විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක් හඳුන්වා දෙන ලදී. |
| 17 | 2084/30<br>2018.08.16 | 2018.08.16 | සීනි | සීනි සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද (සුදු සීනි සඳහා රු. 31/-, දුඹුරු සීනි සඳහා රු. 33/-) තවත් මාස 06ක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී. |
| 18 | 2085/36<br>2018.08.25 | 2018.08.25 | එළවළු තෙල් (ආහාරයට ගත හැකි) | ජාත්‍යන්තර වෙළඳපොළ මිළ පහළ වැටීම සහ දේශීය පොල් මිලෙහි පහළ වැටීම සැළකිල්ලට ගනිමින් ආහාරයට ගතහැකි තෙල් ආනයනය සඳහා බද්ද කිලෝග්‍රෑමයට රු. 20/- කින් ඉහළ නංවන ලදී. |
| 19 | 2087/76<br>2018.09.07 | 2018.09.07 | මැකරල් මාළු, පීස්, කඩල, කව්පි, කුරක්කන් | දේශීය වෙළෙඳපොළ සහ දේශීය ටින් මාළු කර්මාන්තයේ මිල ස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින් වසරක් සඳහා පවත්නා බදු අනුපාතයන්හි වලංගු කාලය දීර්ඝ කරන ලදී. |
| 20 | 2089/19<br>2018.09.17 | 2018.09.18 | සීනි | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද ඉවත් කරන ලදී. (කිලෝග්‍රෑමයට රු. 30/- ක නිෂ්පාදන බද්දක් හඳුන්වා දෙන ලදී. එමෙන්ම, රේගු ආනයන බද්ද, වරාය හා ගුවන්තොටුපල සංවර්ධන බද්ද සහ ජාතිය ගොඩනැංවීමේ බද්ද අදාළ කරන ලදී). |
| 21 | 2090/47<br>2018.09.29 | 2018.10.01 | මාළු, යෝගට්, බටර්, සුදුළූණු, දොඩම්, මිදි, ඇපල්, උළු හාල්, කුරක්කන් පිටි, රටකජු, අබ | සියලුම මාළු වර්ග ආනයනය මත පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද කිලෝග්‍රෑමයට රු. 25/- සිට රු. 100/- දක්වා හෝ 10%ක ප්‍රතිශතයකින් ඉහළ නංවන ලදී. සෙසු භාණ්ඩ වර්ග 11 සඳහා පවතින වෙළඳ |

| | | | | |
|---|---|---|---|---|
| | | | ඇට, ලූණු | භාණ්ඩ බද්දෙහි වලංගු කාලය තවත් වසරක කාලයකින් දීර්ඝ කරන ලදී. |
| 22 | 2095/16<br>2018.11.01 | 2018.11.02 | අර්තාපල්, බී ළූණු | දේශීය ගොවීන් ආරක්ෂා කිරීම සඳහා පවතින වෙළඳ බදු වලංගු කාලය දින 31 සඳහා දීර්ඝ කරන ලදී. |
| 23 | 2095/21<br>2018.11.01 | 2018.11.02 | කඩල, උඳු, පරිප්පු සහ සීනි | කඩල සහ පරිප්පු සඳහා කිලෝග්‍රෑමයට රු. 5/-ක්ද උඳු සඳහා කිලෝග්‍රෑමයට රු. 25/-ක්ද වශයෙන් ආනයන බදු අඩු කරන ලදී. රතු සීනි සඳහා රු. 35/-ක්ද, සුදු සීනි සඳහා රු. 32/-ක් ද වශයෙන් විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනවන ලදී. |
| 24 | 2096/21<br>2018.11.07 | 2018.11.08 | මුංඇට, මැංගුස්ටීන්, වියලන ලද දොඩම්, පෙයාර්ස්, චෙරි, ප්ලම්ස්, කිවි ෆෲට්, දෙළුම්, හාල්මැස්සන් සහ කරවල | මෙම භාණ්ඩ වර්ග 10 සඳහා පවතින විශේෂ වෙළඳ භාණ්ඩ බදු වලංගු කාලය තවත් වසරකින් දීර්ඝ කරන ලදී. |
| 25 | 2098/27<br>2018.11.23 | 2018.11.24 | වටානා | ජීවන වියදම අඩු කිරීම සඳහා වටානා මත ආනයන බද්ද් රු. 10/- කින් අඩු කිරීම. |
| 26 | 2100/2<br>2018.12.03 | 2018.12.03 | අර්තාපල්, බී ළූණු | ජීවන වියදම අඩු කිරීම සහ දේශීය අස්වනු පහත වැටීම යන කරුණු සැළකිල්ලට ගෙන අර්තාපල් සහ බී ළූණු ආනයනය සඳහා පැවති විශේෂ වෙළඳ භාණ්ඩ බදු කිලෝග්‍රෑමයට රු. 20/-කින් අඩු කරන ලදී. |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

## 2.5 බන්ධිත ගුදම්

බන්ධිත ගුදම් යනු තීරුබදු අයකර ගනු ලබන භාණ්ඩ මුදල් ගෙවීමකින් තොරව ගබඩා කළ හැකි, හැසිරවිය හැකි හෝ නිෂ්පාදන ක්‍රියාවලීන් යටතට පත් කළ හැකි ගොඩනැගිල්ලක් හෝ වෙනත් සුරක්ෂිත ප්‍රදේශයකි. එය රජය විසින් හෝ පෞද්ගලික ව්‍යවසායකයන් විසින් පාලනය කරනු ලැබිය හැකිය.

රේගු ආඥා පනතේ 69 වන වගන්තියට අනුව, අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා ගැනීමෙන් පසුව, රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයාට බන්ධිත ගුදම් සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ස්ථානයක් තෝරා ගත හැකිය.

රේගු ආඥා පනතේ 84 වගන්තියට අනුව, රේගු ආඥා පනතේ 69 වගන්තිය යටතේ අනුමැතිය ලබා දී ඇති පරිදි රටේ ආර්ථික සංවර්ධනය උදෙසා ඕනෑම භාණ්ඩයක් බන්ධිත ගුදම් තුළදී නිෂ්පාදනය කිරීම, එකලස් කිරීම, සැකසීම සඳහා අවසර දීමට රේගු අධ්‍යක්ෂවරයාට නෛතික බලතල හිමි වේ. ඒ අනුව, වර්තමානයේදී පහත සඳහන් වර්ගීකරණ යටතේ බන්ධිත පහසුකම් ක්‍රියාත්මක වේ.

- දේශීය පරිභෝජනය සහ ප්‍රති - අපනයනය සඳහා සීනි සහ සහල් ඇතුළු භාණ්ඩ සැපයුම සඳහා
- අපනයන අභිමුඛ ව්‍යවසායන් සඳහා භාණ්ඩ සැපයීම සඳහා
- නැව්තොට හෝ ගුවන් තොටුපල සේවා / තීරුබදු රහිත සාප්පු සැපයුම් සේවා සඳහා
- නැව් / ගුවන් යානා සඳහා භාණ්ඩ සැපයීම සඳහා
- රේගු නිෂ්පාදන යටතේ වන භාණ්ඩ සඳහා
- විවිධ රටවලින් පැමිණෙන භාණ්ඩ තොග සඳහා
- මගීන් රහිතව පැමිණෙන ගමන් මළු නිදහස් කිරීම සඳහා
- සීඝ්‍රගාමී භාණ්ඩ නිදහස් කිරීම සඳහා

බන්ධිත ගුදම් ඉදි කිරීම හෝ ප්‍රතිස්ථානගත කිරීම් සඳහා ලැබෙන අයදුම්පත් රේගු අධ්‍යක්ෂවරයාගේ නිර්දේශයෙන් අනතුරුව, අමාත්‍යවරයාගේ අනුමැතිය සඳහා මෙම දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත කරනු ලබයි.

## 2.6 ශ්‍රී ලංකා මහ බැංකුව සම්බන්ධ කරුණු

1953 අංක 24 දරණ විනිමය පාලන පනත 2017 නොවැම්බර් මාසයේදී අවලංගු කරනු ලැබූ බැවින් ශ්‍රී ලංකාවෙන් පිටත ආයෝජනය සඳහා විදේශීය ආයෝජන ඉවත් කර ගැනීමට කරනු ලබන ඉල්ලීම්, 1953 අංක 24 දරන විනිමය පාලන පනතෙහි විධි විධාන කඩ කිරීම් සම්බන්ධයෙන් විනිමය පාලන දෙපාර්තමේන්තුව මඟින් පැනවූ දඩුවම් ලිහිල් කිරීම / අවලංගු කිරීම සම්බන්ධයෙන් ආයෝජකයන්, බලයලත් වෙළඳුන්, මුදල් හුවමාරු කරන්නන් වැනි පාර්ශවයන් විසින් කරන ලද ඉල්ලීම් මෙම දෙපාර්තමේන්තුව වෙත ලැබී නොමැත. කෙසේ වෙතත් විදේශ මූලාශ්‍රවලින් ශ්‍රී ලංකාව ලබා ගන්නා ණය බැර කිරීමේ ක්‍රියාවලිය සඳහා ආයෝජකයන් 06 දෙනෙකුට, අවස්ථා 03 කදී ශ්‍රී ලංකා රජයට සහ රාජ්‍ය බැංකු 03ක් සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවෙහි නිර්දේශය මත පදනම්ව සහ 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතෙහි විධි විධාන යටතේ නිකුත් ඇති නියෝගයන්ට සිදු කිරිමට නියමිත සංශෝධනවලට යටත්ව, මුදල් අමාත්‍යවරයාගේ අවසරය ලබා ගැනීම සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව පහසුකම් සලසා දී ඇත. අදාල තොරතුරු 2.12 වැනි වගුවේ දක්වා ඇත.

## 2.12 විදේශ විනිමය පනත යටතේ ගරු මුදල් අමාත්‍යවරයා විසින් ලබා දුන් අනුමැතීන්

| | නම | මුදල | කාරණය | අංශය | විශේෂ කරුණු (ශ්‍රී ලංකා රජය/ පුද්ගලික |
|---|---|---|---|---|---|
| 1 | ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැංකුව, ඩුබායි-ජත්‍යාන්තර මූල්‍ය මධ්‍යස්ථාන ශාඛාව වෙතින් ලබා ගැනීමට නියමිත ඇ.ඩො. මිලියන 4ක් දක්වා වූ ණය මුදල සෘජුවම සයිම් සිටි සිමෙන්ති (ලංකා) පුද්ගලික සමාගම්හි ගිණුමට (SLPL) බැර කිරීම සඳහා | ඇ.එ.ජ.ඩො. මිලියන 4 | | - | පුද්ගලික |
| | ටෝකියෝහි සයිබුෂින්කින් (Seibushinkin Bank) බැංකුව වෙතින් ලබා ගැනීමට නියමිත ජපන් යෙන් මිලියන 120ක ණය මුදල සෘජුවම ශ්‍රී ලංකාවෙහි ට්‍රී ඔෆ් ලයිෆ් (පුද්) සමාගමෙහි ගිණුමට (TLPL) බැර කිරීම සඳහා | ජපන් යෙන් මිලියන 120 | | - | පුද්ගලික |
| | ට්‍රී ටස්ට් (පුද්) සමාගම විසින් එහි කොටස්කාර, ඉරාක ජාතික අමීන් අබීද් මහතාගෙන් ලබා ගැනීමට නියමිත ඇ.ඩො. 400,000/- ණය මුදල ට්‍රී ටස්ට් (පුද්) සමාගමෙහි ගිණුමට බැර කිරීම සඳහා (ඉරාක නෛතික බාධකයක් හේතුවෙන් අබීද් මහතාට තම ආමුඛ ආයෝජන ගිණුමට මුදල් සෘජුව බැර කළ නොහැක) | ඇ.ඩො. 400,000/- | | - | පුද්ගලික |
| | පීස් ෆයර් පුද්ගලික සමාගම විසින් ඇමරිකාවේ පී.එන්.සී බැංකුව වෙතින් ලබා ගැනීමට නියමිත ඇ.එ.ජ.ඩො.බිලියන 02 ක ණය මුදල පීස් ෆයර් සමාගමේ ගිණුමට සෘජුව බැර කිරීම සඳහා | ඇ.ඩො.බි 2 | | | පුද්ගලික |

| | | | | | |
|---|---|---|---|---|---|
| 2 | අන්ක්‍රෙඩිට් බැන්ක් ඔස්ට්‍රේලියා | යූරෝ 4,928,000 | | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | ශ්‍රී ලංකා රජය |
| | හොංකොං හි හොංකොං ෂැන්හයි බැන්කින් කෝපරේෂන් | ඇ.ඩො. 79,787,506.80 | | | ශ්‍රී ලංකා රජය |
| 3 | හොංකොං හි හොංකොං ෂැන්හයි බැන්කින් කෝපරේෂන් | ඇ.ඩො. 72,250,000 | තෝරාගත් රෝහල් වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම සඳහා | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | ශ්‍රී ලංකා රජය |
| 4 | ණය අරමුදල් බැර කිරීම සඳහා ආමුඛ ආයෝජන ගිණුමක් විවෘත කිරීමේ අවශ්‍යතාවයෙන් චයිනා ඩිවෙලොප්මන්ට් බැංකුව නිදහස් කිරීම සඳහා | ඇ.ඩො. මිලියන 1000 | සඳහන් කර නැත | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය | |
| | චීනයෙහි චයිනා නැෂනල් කෙමිකල් ඉංජිනියරින් ඉදිකිරීම් සමාගම (CNCEC) | ඇ.ඩො. මිලියන 43.775 | බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන්තොටුපල | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 | |

| | | | | | |
|---|---|---|---|---|---|
| 5 | | | සංවර්ධන ව්‍යාපෘතියෙහි 2 වන අදියරෙහි 11 වැනි මණ්ඩලයට සමගාමීව, ගුවන්යානා සඳහා ඉන්ධන නැවත පිරවීමේ මධ්‍යනස්ථානයක් සඳහා දැනට ක්‍රියාත්මක ඉන්ධන හයිඩරන්ට් නල පද්ධතිය වැඩිදියුණු කිරීම සහ නව ඉන්ධන හයිඩරන්ට් පද්ධතිය | නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | |
| | මහජන බැංකුව (PB) | ඇ.ඩො. මිලියන 7.725 | | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | |
| 6 | ඔපෙක් අරමුදලින් ණය ලබා ගැනීමට සිටිසන් ඩිවෙලොප්මන් බිස්නස් ෆිනැන්ස් පී.එල්.සී. (CDBF) සමාගම සඳහා | ඇ.ඩො. මිලියන 10 | සිටිසන් ඩිවෙලොප්මන් බැංකුව විසින් විවෘත කර පවත්වාගෙන යාමට නියමිත ව්‍යාපාර විදේශ ව්‍යාපාර මුදල් ගිණුමට ජත්‍යාන්තර සංවර්ධනය සඳහා වූ ඔපෙක් අරමුදලෙන් සෘජුවම බැරකිරීම සඳහා | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | |
| 7 | ආමුඛ ආයෝජන ගිණුම හරහා ණය මුදල ලබා ගැනීම හෝ පියවීම සිදුනොකොට, ජර්මනියෙහි කොමර්ස් බැන්ක් (Commerz | ඇ.ඩො. මිලියන 100 | සඳහන් කර නැත | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති | |

| | | | | | |
|---|---|---|---|---|---|
| | Bank) වෙතින් ඇ.ඩො. මිලියන 100 ක ණය මුදලක් සඳහා ජාතික ඉතිරි කිරීමේ බැංකුව සඳහා | | | අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | |
| 8 | 2% වාර්ෂික පොළී අනුපාතය මත ජපානයෙහි සෙයිබු ෂින්කින් බැංකුවෙන් ජපන් යෙන් මිලියන 40,000 ක ණය මුදලක් ලබා ගැනීම සඳහා | ජපන් යෙන් මිලියන 40,000 | | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | පුද්ගලික |
| 9 | සිලෝන් බාටා කම්පැණි ලිමිටඩ් ආයතනයට, සිය මව් සමාගම වන නෙදර්ලන්තයෙහි බාෆින් සමාගම වන නෙදර්ලන්තයෙහි බාෆින් සමාගමෙන් පොළී රහිත පදනම සහ ආමුඛ ආයෝජන ගිණුම තුළින් ණය මුදල් ලබා ගැනීම සහ පියවීම සිදු නොකෙරේය යන කොන්දේසි මත , ණය ලබා ගැනීම සඳහා<br><br>පීස් ෆයාර් පුද්ගලික සමාගම(PPC) විසින් ඇමෙරිකාවේ පීඑන්සී බැංකුව වෙතින් ලබා ගැනීමට නියමිත ඇ.එ.ජ. ඩොලර් බිලියන 2 ක ණය මුදල පීස් ෆයර් පුද්ගලික සමාගමෙහි ගිණුමට සෘජුව බැර කිරීම සඳහා<br><br>අන්ක්‍රෙඩිටඩ් බැන්ක් ඔස්ට්‍රේලියා UBAA (AG) | ඇ.එ.ජ.ඩො 600,000<br><br>ඇ.එ.ජ.ඩො.බි.02<br><br>යූරෝ 4,928,000 | | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | පුද්ගලික |

| | | | | | |
|---|---|---|---|---|---|
| 10 | අපනයන ණය පහසුකමක් වශයෙන් මහා බ්‍රිතාන්‍ය පවුම් 39,471,355.44 ක මුදලකට සමාන මුදලක් ඇ.එ.ජ.ඩොලර් වලින් මුදලකට ඩොයිෂ් බැන්ක් ලන්ඩන් ශාඛාව තුළින් ටෝකියෝ බැංකුව වශයෙන් හැඳින් වූ MUFG බැන්ක් ලිමිටඩ් සහ බ්‍රිතාන්‍ය අපනයන ණය ඇපකර දෙපාර්තමේන්තුව වෙතින් ලබා ගැනීම<br><br>වාණිජ්‍ය පහසුකමක් වශයෙන් මහා බ්‍රිතාන්‍ය පවුම් 9,867,838.86 කට සමාන ණය මුදලක් ඇ.එ.ජ.ඩොලර් වලින් ලබා ගැනීම | මහා බ්‍රිතාන්‍ය පවුම් 39,471,355.44 | රටෙහි ග්‍රාමීය ප්‍රදේශ සංවර්ධනය කිරීම, ග්‍රාමීය ප්‍රදේශ සහ නගර ආශ්‍රිත ප්‍රදේශ අතර සබඳතාවය ඇති කිරීම, ජල ගැලීම් කාලයන් තුළ මරණයෙන් ආරක්ෂාව සහතික කිරීම, ප්‍රජා සබඳතා වැඩිදියුණු කිරීම සඳහා 2014-2015 කාලයේදී ස්ථාපිත කරන ලද සහ දැනට ක්‍රියාත්මක පාලම් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා භාවිතා කිරීමට | 2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ 2017 නොවැම්බර් 17 වැනි දිනැති අංක 2045/56 දරණ රජයේ ගැසට් පත්‍රයේ පළ වූ 2017 අංක 1 දරණ නියෝගය ප්‍රකාරව ( 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වැනි වගන්තිය) | ශ්‍රී ලංකා රජය |

## 2.7 රේගු නඩු

රේගු ආඥාපනතේ 164 සහ 165 වගන්ති ප්‍රකාරව, අගතියට පත් පාර්ශව විසින් කරන ලද අභියාචනා සලකා බැලීම සඳහා ගරු අමාත්‍යවරයාට බලය ඇත. ඒ අනුව, නීති විරෝධී ආනයන හා අපනයන ආදි කරුණු පිළිබඳව වූ රේගු නියෝග වලට එරෙහිව සිදුකරන ලැබූ අභියාචනා සම්බන්ධව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ක්‍රියාමාර්ග ගන්නා ලදි.

- ✓ ලැබුනු අභියාචනා සංඛ්‍යාව - 42
- ✓ කැඳවනු ලැබූ නිරීක්ෂණ සංඛ්‍යාව - 46
- ✓ අමාත්‍යවරයා වෙත යොමු කළ වාර්තා සංඛ්‍යාව - 24
- ✓ අමාත්‍යවරයා විසින් අනුමත කළ තීරණ සංඛ්‍යාව - 19

## 2.8 අධිකරණ නඩු

රේගු ආඥාපනත, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත සහ ආදායම් ආරක්ෂණ පනත යටතේ ගනු ලැබූ තීරණ හෝ ක්‍රියාමාර්ග හේතුවෙන් අගතියට පත් පාර්ශවයන් ඒ පිළිබඳව අධිකරණය ඉදිරියේ අභියෝගයට ලක් කරනු ලබයි. මෙම දෙපාර්තමේන්තුවට හෝ මුදල් අමාත්‍යාංශයට එරෙහිව ගොනු කර ඇති අධිකරණ නඩු සම්බන්ධ නිරීක්ෂණ ඉදිරිපත් කිරිම හා ඊට අදාල අනිකුත් කාර්යයන් පිළිබඳව වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරනු ලබයි. අධිකරණ තුළ දැනට පවත්නා නඩු වෙළෙද, බලපත්‍ර නිකුත් කිරීම්, බදු, විදේශ වෙළෙද ගිවිසුම් යනාදි විෂයන්ට සම්බන්ධ ඒවා වේ.ඉහත සඳහන් අධිකරණ ක්‍රියාමාර්ග වලට අදාලව සකස් කළ නිරීක්ෂණ සංඛ්‍යාව 11 සහ ක්‍රියා කළ නඩු සංඛ්‍යාව 24 ක් වේ.

## 2.9 විශේෂ ව්‍යාපෘති අංශය

### 2.9.1 රාජ්‍ය නිලධාරීන් සඳහා සහනදායී කොන්දේසි මත වාහන ආනයනය කිරීම සඳහා බලපත්‍ර නිකුත් කිරීමේ යෝජනා ක්‍රමය

2018 පෙබරවාරි 15 වන වැනි දින 2018/01 අංක දරන වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති චක්‍රලේඛය නිකුත් කරනු ලැබූ අතර ; වාහන බලපත්‍ර ලබා ගැනීමට සුදුසුකම් ලැබීම සඳහා සපුරා තිබිය යුතු සේවා කාලය සහ අදාළ බදු ප්‍රමාණයන් සංශෝධනය කිරීම යන කරුණු සම්බන්ධයෙන් පිළිවෙළින් 01/2018 (1) චක්‍රලේඛය සහ 21/2018 (2) චක්‍රලේඛය නිකුත් කරන ලදී. ඒ අනුව, එම චක්‍රලේඛය යටතේ වාහන බලපත්‍ර 746 ක් , මුදල් හා ජන මාධ්‍ය අමාත්‍යාංශයේද එහි දෙපාර්තමේන්තුවලද මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය යටතේ පවතින වෙනත් ව්‍යවස්ථාපිත ආයතන වලද සේවය කළ නිලධාරීන් සඳහා නිකුත් කරන ලදී. සපයා ඇති තොරතුරු වලට අනුව මෙම යෝජනා ක්‍රමය යටතේ 2018 වසර තුළ වාහන බලපත්‍ර 13540 ක් නිකුත් කොට ඇත. ( මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයෙහි නිලධාරීන් සඳහා නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව ද ඇතුලත්ව )

### 2.9.2 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ බලපත්‍ර ලබාදීම

වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 22/99 යටතේ රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරින් වෙත විශ්‍රාම යන අවස්ථාවේදී ලබා දෙනු ලබන සහනදායී වාහන ආනයන බලපත්‍ර නිකුත් කිරීම

සම්බන්ධයෙන් කටයුතු කරනු ලැබේ. ඒ අනුව,බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් කාර්යයන් සිදුකර ඇත.

- ✓ ලැබුනු අයදුම්පත් සංඛ්‍යාව - 427
- ✓ ප්‍රතික්ෂේපිත අයදුම්පත් සංඛ්‍යාව - 024
- ✓ නිකුත් කළ බලපත්‍ර සංඛ්‍යාව - 398
- ✓ පැමිණිලි සහ අභියාචනා සංඛ්‍යාව - 013

### 2.9.3 රාජ්‍ය තාන්ත්‍රික නිලධාරීන් සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශ චක්‍රලේඛ අංක 210 යටතේ සහනදායි කොන්දේසි මත මෝටර් රථ ආනයන කිරීමේ යෝජනා ක්‍රමය

2018 වසරේදී විදේශ කටයුතු අමාත්‍යාංශය විසින් වෙනත් රටවල සේවය කල ශ්‍රී ලංකා දූත සේවයේ නිලධාරීන් සහ ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශයේ සේවළ කල සුදුසුකම් සපුරා ඇති නිලධාරීන් 97 දෙනෙකු සඳහා වාහන බලපත්‍ර නිකුත් කොට තිබුණි. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුව එකී වාහන බලපත්‍ර මත ආනයනය කරන ලද වාහනවලට අදාළ රේගු නිෂ්කාෂණය සඳහා බදු නිදහස් කිරීමේ ලිපි නිකුත් කොට ඇත.

### 2.9.4 විවිධ බදු සහන යටතේ ආනයනය කරන ලද වාහන අපහරණය කිරීම

විවිධ බදු සහන යෝජනා ක්‍රම යටතේ මෙරටට ආනයනය කරන ලද වාහන 76 ක් අපහරණය කිරීම සඳහා පහසුකම් සපයා ඇත.

### 2.9.5 බදු නිදහස් කිරීම

රේගු අඥා පනතේ 19 (අ) වගන්තිය (235 වැනි අධිකාරිය) යටතේ අමාත්‍ය මණ්ඩලයෙහි අනුමැතිය සහිත විශේෂ ව්‍යාපෘති සම්බන්ධයෙන් රේගු ආනයන බදු කපා හැරිය හැකිය. ඒ අනුව, 2018 වසරේදී මාර්ග සහ මහා මාර්ග, ගුවන් තොටුපොල හා ගුවන් සේවා, වරාය හා ධීවර වරාය, ජලසම්පාදන හා වාරිමාර්ග, විදුලිබල, නිවාස යෝජනා ක්‍රම, රෝහල් හා විශ්වවිද්‍යාල ඉදි කිරීම් ආදී ක්ෂේත්‍රයන් ආවරණය කරන ලද ව්‍යාපෘති සඳහා තීරුබදු කපා හැරීම් පිරිනමන ලදී. 2018 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම්වල සාරාංශයක් පහත 2.13 වගුවෙහි දැක්වේ.

**2.13 වගුව - රේගු අඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ විශේෂ ව්‍යාපෘති සඳහා 2018 වසරේදී පිරිනමනු ලැබූ බදු කපාහැරීම්**

| අංකය | අංශය | බදු කපා හැරීම් සඳහා නිකුත් කළ ලිපි සංඛ්‍යාව |
|---|---|---|
| 1 | ආරක්ෂක | 48 |
| 2 | අධ්‍යාපන | 18 |
| 3 | සෞඛ්‍ය | 24 |
| 4 | යටිතල පහසුකම් | 510 |
| 5 | ජල සම්පාදන | 128 |
| 6 | වෙනත් | 540 |
| එකතුව | | **1,268** |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම දෙපාර්තමේන්තුව විසින් තීරු බදු කපා හැරීම සඳහා බලය පැවරී ඇති මුත් 2018 වර්ෂය තුළදී ලබා දුන් තීරු බදු කපා හැරීම් පිළිබඳ සාරාංශයක් 2.14 වගුවේ දක්වා ඇත.

**2.14 වගුව - රේගු ආඥා පනතේ 19 (අ) වගන්තිය යටතේ තීරු බදු කපා හැරීම්**

| අංකය | අයිතමය | රේගු ආනයන බදු අනුපාතය | බදු කපා හැරීම (රු.) | අයකරගත හැකි රේගු ආනයන බදු (රු) | කාල පරිච්ඡේදය |
|---|---|---|---|---|---|
| 1. | ඩීසල් | ලීටරයකට රු. 15/- | ලීටරයකට රු. 11/- | ලීටරයකට රු. 4/- | 2017.12.22 සිට 2018.05.10 දක්වා |
| | | ලීටරයකට රු. 15/- | ඩීසල් - ලීටරයකට රු. 9.15 | ඩීසල් -5.85 | 2018.05.11 සිට 2018.05.15 දක්වා |
| | | | සුපර් ඩීසල් - ලීටරයකට රු. 4.45 | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | |
| | | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | 2018.05.16 සිට 2018.11.19 දක්වා |
| | | ඩීසල් - ලීටරයකට රු. 5.85 | ඩීසල් - ලීටරයකට රු. 2 | ඩීසල් - ලීටරයකට රු. 3.85 | |
| | | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | |
| | | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | 2018.11.20 සිට 2019.01.11 දක්වා |
| | | ඩීසල් - ලීටරයකට රු. 5.85 | ඩීසල් - ලීටරයකට රු. 5 | ඩීසල් - ලීටරයකට රු. 0.85 | |
| | | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | |
| | | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | සුපර් ඩීසල් - ලීටරයකට රු. 10.55 | 2019.01.12 සිට අද දක්වා |
| | | ඩීසල් - ලීටරයකට රු. 5.85 | ඩීසල් - ලීටරයකට රු. 3 | ඩීසල් - ලීටරයකට රු. 2.85 | |
| | | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | බදු කපාහැරීම් නොමැත | වෙනත් ඩීසල් - ලීටරයකට රු. 10.55 | |
| 2. | පෙට්‍රල් | ලීටරයකට රු. 35/- | ලීටරයකට රු. 23/- | ලීටරයකට රු. 12/- | 2017.12.22 සිට 2018.05.10 දක්වා |
| | | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 9.58<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 9.41 | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 25.42<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 25.59 | 2018.05.11 සිට 2018.05.15 දක්වා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 25.42<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 25.59<br>වෙනත් - ලීටරයකට රු. 25.59 | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 7/- | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 18.42<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 25.59<br>වෙනත් - ලීටරයකට රු. 25.59 | 2018.05.16 සිට 2018.11.01 දක්වා |
| | | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 13/- | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 12.42<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 25.59<br>වෙනත් - ලීටරයකට රු. 25.59 | 2018.11.02 සිට 2018.11.15 දක්වා |
| | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 35/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 35/-<br>වෙනත් - ලීටරයකට රු. 35/- | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 20/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 3/-<br>වෙනත් - ලීටරයකට රු. 3/- | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 15/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 32/-<br>වෙනත් - ලීටරයකට රු. 32/- | 2018.11.16 සිට 2018.12.27 දක්වා |
| | | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 20/-<br>ඔක්ටේන් 95 - බදු කපාහැරීම් නොමැත<br>වෙනත් - ලීටරයකට රු. 3/- | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 15/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 35/-<br>වෙනත් - ලීටරයකට රු. 32/- | 2018.12.28 |
| | | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 20/-<br>ඔක්ටේන් 95 - බදු කපාහැරීම් නොමැත<br>වෙනත් - බදු කපාහැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 15/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 35/-<br>වෙනත් - ලීටරයකට රු. 35/- | 2018.12.29 සිට 2019.01.11 දක්වා |
| | | | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 19/-<br>ඔක්ටේන් 95 - බදු කපාහැරීම් නොමැත<br>වෙනත් - බදු කපාහැරීම් නොමැත | ඔක්ටේන් 92 - ලීටරයකට රු. 16/-<br>ඔක්ටේන් 95 - ලීටරයකට රු. 35/-<br>වෙනත් - ලීටරයකට රු. 35/- | 2019.01.12 සිට අද දක්වා |
| 3. | ලිහිසි තෙල් | 15% | 3% | 12% | 2018.11.02 සිට අද දක්වා |
| 4. | තිරිඟු ඇට | 15% හෝ කිලෝග්රෑමයට රු.12/- | කිලෝග්රෑමයට රු.6/- | කිලෝග්රෑමයට රු.6/- | 2017.08.02 සිට 2018.11.01 දක්වා |
| | | | කිලෝග්රෑමයට රු.9/- | කිලෝග්රෑමයට රු.3/- | 2018.11.02 සිට අද දක්වා |
| 5. | කිරි පිටි | 20% හෝ කිලෝග්රෑමයට රු. 225/- | කිලෝග්රෑමයට රු.223/- | කිලෝග්රෑමයට රු.2/- | 2017.07.08 සිට 2018.09.18 දක්වා |
| | | | කිලෝග්රෑමයට රු.175/- | කිලෝග්රෑමයට රු.50/- | 2018.09.19 සිට 2018.10.02 දක්වා |
| | | | කිලෝග්රෑමයට රු.223/- | කිලෝග්රෑමයට රු.2/- | 2018.10.03 සිට 2018.10.16 දක්වා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | කිලෝග්රැමයට රු.210/- | කිලෝග්රැමයට රු.15/- | 2018.10.17 සිට අද දක්වා |
| 6. | කජු මද | 30% | 30% | නිදහස් | 2017.10.07 සිට අද දක්වා |
| 7. | සීනි | කිලෝග්රැමයට රු. 12/- | කිලෝග්රැමයට රු.4/- | කිලෝග්රැමයට රු.8/- | 2018.09.19 සිට 2018.11.01 දක්වා |
| | | | සටහන: 2018.10.16 වැනි දිනට පෙර ආනයනය කරන ලද වරායන්හි පැවති තොග සඳහා කිලෝග්‍රෑමයට රු. 12/- බැගින් සම්පූර්ණ බදු නිදහස් කිරීමක් ලබා දෙන ලදී. එය 2018.10.26 දක්වා බලාත්මක විය. | | |

මූලාශ්‍රය - වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව - 2018

### 2.9.6. අපනයන සැකසුම් යෝජනා ක්‍රමය සඳහා ආනයනය.

ශ්‍රී ලංකාව සඳහා ප්‍රමාණවත් ආදායමක් (විදේශ විනිමය) උපයා ගැනීම සඳහා අපනයන ප්‍රවර්ධනය ඇති කිරීම පිළිබඳව වෙළඳ පහසුකරණය සැලසීමේ පියවරක් වශයෙන් මෙම යෝජනා ක්‍රමය හඳුන්වාදෙනු ලැබීය. එමෙන්ම, මෙම යෝජනා ක්‍රමය යටතේ රටෙහි සුළු හා මධ්‍ය පරිමාන ව්‍යවසායකයන් හට අවශ්‍ය අමුද්‍රව්‍ය හා යන්ත්‍ර සූත්‍ර වඩා පහළ මිලක් යටතේ ආනයනය කිරීමට ඉඩදීම මගින් ඔවුන් හි තරඟ කිරීම සඳහා සවිබල ගැන්වීමටත් අපේක්ෂා කෙරේ.

මෙම යෝජනා ක්‍රමය යටතේ, වෙළඳ හා වානිජ අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිව ඇති ආයෝජකයන් සහ, ආයෝජන මණ්ඩල පනතේ 16 වැනි වගන්තිය යටතේ, අපනයන අරමුණු සඳහා, තීරුබදු රහිතව යෙදවුම් අපනයනය කිරීම සඳහා අවස්ථාව නොලැබෙන්නන් සඳහා පහසුකම් සැලසේ. මෙම යෝජනා ක්‍රමය සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සැකසුම මෙම දෙපාර්තමේන්තුව විසින් ඉටු කරනු ලැබේ. ඒ අනුව, අපනයන සැකසුම් සඳහා තාවකාලික ආනයන යෝජනා ක්‍රමය යටතේ, පුවක් සහ ගම්මිරිස් යන ද්‍රව්‍ය සම්බන්ධ ආනයන කටයුතු විධිමත් කිරීම සඳහා, අමාත්‍ය මණ්ඩලය විසින් මෙම අමාත්‍යාංශයෙහි භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ සභාපතිත්වයෙන් යුතු නිල කමිටුවක් පත්කොට ඇත. එම කමිටුව විසින් යෝජනා කරනු ලබන ක්‍රියාපටිපාටි සකස් කිරීමේ කාර්යය මෙම දෙපාර්තමේන්තුව විසින් සිදුකරනු ලබන අතර, ඒ පිළිබඳ වාර්තාවක් 2018.08.06 වැනි දින අමාත්‍ය මණ්ඩලය වෙත සටහනක් වශයෙන් ඉදිරිපත් කොට ඇත.

## 2.10 වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සකස් කිරීම සහ මෙම දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සකස් කිරීම.

2018 වර්ෂයේදී, විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත, ආදායම් සංරක්ෂණ ආඥා පනත, රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක.22/99 සහ අදාළ වෙනත් කරුණු යටතේ, අමාත්‍ය මණ්ඩල සංදේශ 16 ක් මෙම දෙපාර්තමේන්තුව විසින් සකස් කරන ලදි. එමෙන්ම, වෙනත් අමාත්‍යාංශ විසින් ඉදිරිපත් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ 29 ක් ද මෙම දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කොට ඇත.

## 2.11 සාර්ක් සංවර්ධන අරමුදල

සාර්ක් සංවර්ධන අරමුදල යනු ව්‍යාපෘති සහයෝගීතාවය තුළින් කලාපීය සහයෝගීතාවය සහ ඒකාබද්ධතාවය ඇති කිරීම සඳහා දායකත්වය ඉලක්ක කර ගත් මූල්‍යාධාර සපයන ආයතනයකි. 2010 වසරේ සිට සාර්ක් සංවිධානය තුළ ව්‍යාපෘති සහ වැඩසටහන් සඳහා මූල්‍යාධාර සපයන ඒකාබද්ධ සංවිධානයක් වශයෙන් ක්‍රියාත්මක වන සාර්ක් සංවර්ධන අරමුදල සාර්ක් කලාපීය රටවල්වල ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සහ ආර්ථික වර්ධනය වේගවත් කිරීම සමාජ අභිවෘද්ධිය ඇති කිරීම සහ දිළිඳු බව අවම කිරීම තුළින් සුබ සාධනය ඇති කිරීම සඳහා ක්‍රියාත්මක වේ.

සාර්ක් සංවර්ධන අරමුදල තුළ මූල්‍යන කවුළු 03 කි.

**(i) සමාජීය කවුළුව**

මෙ මඟින් මූලික වශයෙන් අධ්‍යාපනය, සෞඛ්‍ය, මානව සම්පත් සංවර්ධනය, සමාජය තුළ අවම පහසුකම් සහිතව දිවි ගෙවන්නන් අරමුණු කර ගනිමින් ක්‍රියාත්මක ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර සැපයේ. ව්‍යාපෘති ක්‍රියාත්මක කරනු ලබන නියෝජිත ආයතන සමඟ සම හවුල්කාරීත්වය(50:50) ඇතිව ප්‍රදානයන් සිදු කරනු ලබයි.

**(ii) ආර්ථික කවුළුව**

මෙමඟින් මූලික වශයෙන්ම වෙළඳ හා කර්මාන්ත සංවර්ධන, කෘෂිකාර්මික සේවා අංශය, විද්‍යා හා වෙනත් යටිතල පහසුකම් නොවන ක්ෂේත්‍ර සඳහා මූල්‍යාධාර පිරිනැමීම සිදු කරයි.

**(iii) යටිතල පහසුකම් කවුළුව**

මෙමඟින් මූලික වශයෙන්ම, බලශක්තිය, ප්‍රවාහනය, සන්නිවේදනය, පරිසරය, සංචාරක කර්මාන්තය සහ වෙනත් යටිතල පහසුකම් අංශ වල ව්‍යාපෘති සඳහා මූල්‍යාධාර පිරිනැමීම සිදු කරයි. ආර්ථික හා යටිතල පහසුකම් කවුළු මූල්‍යන ක්‍රමය යටතේ 100% සුරක්ෂිත ණය සපයනු ලබයි.

සමාජීය කවුළුව යටතේ සාක් රටවල් තුල ව්‍යාපෘති 13 ක් ක්‍රියාත්මක කෙරෙමින් පවතින අතර සෑම ව්‍යාපෘතියක් මඟින්ම සාර්ක් සාමාජික රාජ්‍යයන් එකකට වැඩි සංඛ්‍යාවක් සඳහා ප්‍රතිලාභ ලබා දෙයි.

සමාජීය කවුළුව යටතේ ශ්‍රී ලංකාව තුල මේ වන විට ව්‍යාපෘති 04 ක් සම්පූර්ණ කොට ඇති අතර ක්‍රියාත්මක වෙමින් පවතින ව්යාපෘති සංඛ්‍යාව 02 කි. ආර්ථික හා යටිතල පහසුකම් කවුළුව යටතේ සැලසුම් කෙරෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව 02 කි.

**දැනට ක්‍රියාත්මක ව්‍යාපෘති**

1. සාර්ක් කලාපය තුල ගෘහස්ථ නිෂ්පාදන පදනම් කර ගත් නිෂ්පාදකයින්ගේ ජීවනෝපායන් ශක්තිමත් කිරීම
2. සාර්ක් කලාපය තුල කාන්තාවන්ට හා දරුවන් සඳහා ඔවුන්ගේ ගැටළු විසඳා ගැනීම සඳහා නොමිලයේ උපකාරක දුරකථන සේවා ලබා දීම

**මේ වන විට ව්‍යාපෘති කාර්යයන් සම්පූර්ණ කරන ලද ව්‍යාපෘති**

1. මාතෘ හා ළදරු ප්‍රතිශක්තිකරණය වැඩි දියුණු කිරීම
2. දකුණු ආසියානු කලාපය තුල ළමුන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය අවසන් කිරීම
3. සාර්ක් කලාපීය රටවල පලතුරු නිෂ්පාදනය සම්බන්ධයෙන් පශ්චාත් අස්වනු කලමණාකරණය හා වටිනාකම් එකතු කිරීම සඳහා වන ව්‍යාපෘතිය

4. සාර්ක් කලාපීය රටවල් වල තෝරා ගත් ප්‍රදේශ සඳහා ජලය, සනීපාරක්ෂාව හා සනීපාරක්ෂක සේවා ශක්තිමත් කිරීම සඳහා වන ව්‍යාපෘතිය.

**සැලසුම් කෙරෙමින් පවතින ව්‍යාපෘති**

1. සාර්ක් රටවල කාන්තා ව්‍යවසායකින්ගේ ශක්‍යතාව ඉහළ නැංවීම සහ ඔවුන් අතර සබඳතා ජාලයක් ගොඩ නැංවීම (සාක් අත්කම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම).
2. අගය දාම සංවර්ධනය ඉලක්ක කර ගත් සුළු කෘෂිකාර්මික ව්‍යාපාර අංශය තුළින් සාර්ක් කලාපයේ සුළු පරිමාණ ගොවීන්ගේ ජීවන මට්ටම උසස් කිරීම.

ආර්ථික මූල්‍යාධාර කවුළුව යටතේ, සාර්ක් සංවර්ධන ණය මුදල මෑත කාලීනව ක්ෂුද්‍ර, සුළු සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායයන් සඳහා මූල්‍යාධාර සැපයීමේ යෝජනා ක්‍රමයට ක්‍රියාවට නංවන ලදී. මෙම යෝජනා ක්‍රමය යටතේ ඇ.ඩො.මිලියන 10ක් බෙදාහැරීම සඳහා අරමුදල විසින් සැලසුම් සකස් කොට ඇත.

සාර්ක් සංවර්ධන අරමුදලෙහි ශ්‍රී ලාංකික පාර්ශ්වික නියෝජිත ආයතනය වශයෙන් අරමුදලෙහි සමස්ත සම්බන්ධීකරණය, ව්‍යාපෘති යෝජනා නිර්දේශ කිරීම, ව්‍යාපෘති ප්‍රගතිය සමාලෝචනය කිරීම, වාර්ෂික දායක මුදල් ගෙවීම, ශ්‍රී ලංකාවට පැමිණෙන සාර්ක් සංවර්ධන අරමුදලෙහි නිලධාරීන් සඳහා පහසුකම් සැලසීම වැනි කාර්යයන් ඉටු කිරීම මෙම දෙපාර්තමේන්තුව මඟින් සිදු කෙරේ.

**සාර්ක් මූල්‍ය රැස්වීම්**

වර්ෂ 1998 ජූලි මස 29 වන දින කොළඹදී පැවති 10 වන සාර්ක් සමුළුව අතරතුර එකඟ වූ පරිදි සාර්ක් කලාපීය මහ බැංකු අධිපතිවරුන්ගේ හා සාර්ක් කලාපීය මුදල් ලේකම්වරුන්ගේ කලාපීය සබඳතාවයන් උදෙසා 1998 සැප්තැම්බර් මස 09 වන දින " සාර්ක් මූල්‍යය " (SAARC Finance) ආරම්භ විය. කෙසේ වෙතත් මේ සඳහා විධිමත් පිළිගැනීම ලබාගත හැකි වූයේ වර්ෂ 2002 ජනවාරි මස නේපාලයේ කත්මන්ඩු නුවර පැවති 11 වන සාර්ක් සමුළුව අතරවාරයේදී ය.

සාර්ක් මූල්‍ය ජාලයේ මූලික අරමුණ වන්නේ සාර්ක් රටවල ඇති මහ බැංකු හා මුදල් අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය වර්ධනය කිරීමත් අන්‍යෝන්‍ය වශයෙන් ඒ ඒ රටවල් විසින් ගනු ලැබූ සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අත්දැකීම් හුවමාරු කරගැනීමත්ය. තවද, සාර්ක් මූල්‍ය පහත සඳහන් අරමුණු වලින් යුතු වේ.

- සාර්ක් කලාපීය රටවල මහ බැංකු හා මුදල් අමාත්‍යාංශ අතර සම්බන්ධීකරණය වැඩිදියුණු කිරීම උදෙසා කාර්යමණ්ඩල සංචාර හා නිරන්තර තොරතුරු හුවමාරු කිරීම් සිදුකිරීම.
- කලාපීය බැංකුකරණ නීතිරීති සංගෘහිතකරණය කිරීම පිළිබඳ සලකා බැලීම හා යෝජනා කිරීම.
- සාර්ක් කලාපීය රටවල කාර්යක්ෂම ගෙවීම් පද්ධතියක් ඇතිකිරීම සහ මූල්‍ය මෙන්ම විනිමය සම්බන්ධීකරණය උදෙසා කටයුතු කිරීම.
- සමීප සාර්ව ආර්ථික ප්‍රතිපත්ති පිළිබඳ අන්‍යෝන්‍ය අත්දැකීම් හා අදහස් හුවමාරු කරගැනීම තීව්‍ර කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය අරමුදල, ලෝක බැංකුව හා අනෙකුත් ජාත්‍යන්තර ණය දෙන සංවිධානවල ඇති මූල්‍ය දියුණුව පිළිබඳව හා ඒවායේ කලාපීය බලපෑම හා ඒ හරහා ඇතිවන ගැටළු පිළිබඳ අධ්‍යයනය කිරීම.
- ජාත්‍යන්තර මූල්‍ය හා මූල්‍ය පද්ධතින්හි ඇතිවන වෙනස්කම් අධීක්ෂණය කිරීම හා එකී වෙනස්කම් සඳහා කලාපීය වශයෙන් සාමූහිකව කටයුතු කිරීම.

- ජාත්‍යන්තර වශයෙන් හා මූල්‍ය සේවා නිදහස් කිරීම හරහා අන්‍යොන්‍ය ප්‍රතිලාභ ලැබෙන අයුරින් සාධ්‍ය වූත්, සාමූහික විධි ක්‍රම හා උපායමාර්ග පිළිබඳ පොදු වශයෙන් එක්ව තීරණයක් ගැනීම.
- ආර්ථික විද්‍යාව හා මූල්‍යනය සම්බන්ධව විෂය කරුණු පිළිබඳ කලාපීය වශයෙන් මුදල් හා මහ බැංකු කාර්යමණ්ඩල සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය ප්‍රතිපත්ති, විනිමය අනුපාත වෙනස්කම්, බැංකු අධීක්ෂණය හා ප්‍රාග්ධන වෙළඳපොල ගැටළු සම්බන්ධ කලාපීය පුහුණු ආයතන ජාලකරණය කිරීමට කටයුතු කිරීම සහ,
- අන්‍යොන්‍ය සුහසිද්ධිය උදෙසා වන ආර්ථික හා මූල්‍ය ගැටළු සම්බන්ධයෙන් කරනු ලබන පර්යේෂණ දිරිගැන්වීම.

## 3. පරිපාලන හා මූල්‍ය කාර්ය සාධනය

මානව, භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය කිරීම පරිපාලන හා මූල්‍ය අංශය මගින් සිදු කරයි. මානව සම්පත් කළමනාකරණය යටතේ දෙපාර්තමේන්තුව වෙත නිලධාරීන් බඳවා ගැනීම, පුහුණු හා සංවර්ධනය කිරීම හා ඔවුන් දෙපාර්තමේන්තුව තුළ ස්ථානගත කිරීම සිදුකරනු ලබයි. භෞතික හා මූල්‍ය සම්පත් කළමනාකරණය යටතේ භෞතික හා මූල්‍ය වත්කම් අත්පත් කරගැනීම, නඩත්තු කටයුතු, ගෙවීම් හා වාර්තා පවත්වාගෙන යාමේ කාර්යයන් සිදු ලබයි.

### 3.1 පරිපාලන අංශය

අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුගේ ප්‍රධානත්වයෙන් සැදුම්ලත් මෙම දෙපාර්තමේන්තුව සඳහා අනුමත කාර්ය මණ්ඩලය 62 කි. අනුමත හා වර්තමාන කාර්ය මණ්ඩලය පිළිබඳ තොරතුරු පහත 3.1 වගුවෙහි දක්වා ඇත. මානව සම්පත් කළමණාකරණය පිළිබඳ තොරතුරු 3.2, 3.3, 3.4 හා 3.5 වගුවල දක්වා ඇත.

**වගුව 3.1 - 2018.12.31 දිනට අනුමත කාර්ය මණ්ඩලය**

| අනු පිළිවෙල | තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|
| 1 | අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) | 01 | 01 | - |
| 2 | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (ශ්‍රී.ලං.ප.සේ. විශේෂ ශ්‍රේණිය) | 01 | 00 | 01 |
| 3 | අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. I) | 03 | 02 | 01 |
| 4 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ප.සේ. II/ III) | 06 | 06 | - |
| 5 | නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ (ශ්‍රී.ලං.ක්‍ර.සේ. II/ III) | 01 | 01 | - |
| 6 | ගණකාධිකාරී (ශ්‍රී.ලං.ග.සේ. II/ III) | 01 | 01 | - |
| 7 | තීරුබදු විශ්ලේශක (දෙපාර්තමේන්තුගත) | 02 | 00 | 02 |
| 8 | පරිපාලන නිලධාරී (රා.ක.ස.සේ. අධි) | 01 | 01 | - |
| 9 | භාෂා පරිවර්තක | 02 | 00 | 02 |
| 10 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරී | 01 | 01 | - |

| | | | | |
|---|---|---|---|---|
| 11 | පර්යේෂණ සහකාර/සංවර්ධන නිලධාරී | 08 | 07 | 01 |
| 12 | රාජ්‍ය කළමනාකරණ සහකාර | 20 | 19 | 01 |
| 13 | රියදුරු | 07 | 05 | 02 |
| 14 | කාර්යාල සහායක සේවය | 08 | 06 | 02 |
| එකතුව | | **62** | **50** | **12** |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018*

## වගුව 3.2 - 2018 වර්ෂයේදී දෙපාර්තමේන්තුවට සම්බන්ධවූ නිලධාරීන්

| අනු පිළිවෙල | නම | තනතුර | දෙපාර්තමේන්තුවට සම්බන්ධ වූ දිනය |
|---|---|---|---|
| 1 | එම්.කේ.පී. කුමාර මහතා | අධ්‍යක්ෂ | 2018.03.22 |
| 2 | ජේ.ආර්.සී. ජයතිලක මහතා | අධ්‍යක්ෂ | 2018.03.08 |
| 3 | එස්.ඒ. සේනානායක මහතා | සහකාර අධ්‍යක්ෂ | 2018.07.26 |
| 4 | එච්.ජී.එන්. ආසිරි මහතා | සහකාර අධ්‍යක්ෂ | 2018.02.23 |
| 5 | එස්.ජී.එම්.ඒ.පී. සේනාරත්න මෙය | ගණකාධිකාරී | 2018.02.16 |
| 6 | එස්.එස්. රණවීර මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.03.02 |
| 7 | ඩී.බී.එන්. දොලගේ මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.03.06 |
| 8 | පී.ආර්. ශාන්ති මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.03.07 |
| 9 | එල්.එස්.ජී. පෙරේරා මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.05.23 |
| 10 | එච්.ආර්.එල්.ජේ. මධුභාෂිණී මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.06.01 |
| 11 | ඒ.ඒ.ඩී.ජී. අතපත්තු මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.10.03 |
| 12 | එස්.ජී.එම්.එස්.එස්. තිලකසිරි මෙය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.12.07 |
| 13 | එච්.එන්.එල්. පෙරේරා මහතා | රියදුරු | 2018.03.26 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018*

## වගුව 3.3 - 2018 වසරේදී දෙපාර්තමේන්තුවෙන් ස්ථාන මාරු වී ගිය නිලධාරීන්

| අනු පිළිවෙල | නම | තනතුර | මාරු වී ගිය දිනය |
|---|---|---|---|
| 1 | කේ.ඒ. විමලේන්තිරරාජා මහතා | අධ්‍යක්ෂ ජනරාල් | 2018.01.22 |
| 2 | එම්.එන්.ඩී. ගුණරත්න මිය | අධ්‍යක්ෂ | 2018.03.12 |
| 3 | එම්.ඩී.ජේ.සී. මුරගේ මහතා | අධ්‍යක්ෂ | 2018.03.08 |
| 4 | ඩී.අයි. ද එස්. විජේසිංහ මිය | සංවර්ධන නිලධාරී | 2018.08.23 |
| 5 | සී.පී.කේ. විජේසූරිය මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.02.28 |
| 6 | එම්.ඒ.ඩී.එස්. මල්ලවාරච්චි මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.02.28 |
| 7 | එම්.ජී.එම්.ඩී. විමලරත්න මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.08.03 |
| 8 | ටී.එම්. අමරදාස මහතා | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.08.31 |
| 9 | කේ. මදිවානන් මිය | රාජ්‍ය කළමනාකරණ සහකාර | 2018.12.28 |
| 10 | ඒ.කේ.ආර්.පී. උබේසේකර මහතා | කාර්යාල කාර්ය සහායක | 2018.10.01 |
| 11 | ඩබ්.ජී.එම්. ගුණවර්ධන මිය | කාර්යාල කාර්ය සහායක | 2018.10.01 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018*

වගුව **3.4 - 2018** වසරේදී පුහුණු පාඨමාලා / අධ්‍යයන චාරිකා / විදේශ සම්මන්ත්‍රණ සඳහා සහභාගී වූ නිලධාරීන්

| තනතුර | නම | රට | සහභාගීත්වය | කාලය |
|---|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | සී. ජයසූරිය මහතා | භූතානය | නියෝජිත මණ්ඩල සමුළු | 2018.03.16<br>2018.03.19 |
| | | තායිලන්තය | නියෝජිත මණ්ඩල සමුළු | 2018.09.18<br>2018.09.21 |
| අධ්‍යක්ෂ | දර්ශන විජේසිරිවර්ධන මහතා | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 2018.07.02<br>2018.07.04 |
| | | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 2018.12.21<br>2018.12.22 |
| | එම්.කේ.පී. කුමාර මහතා | නේපාලය | නියෝජිත මණ්ඩල සමුළු | 2018.07.21<br>2018.07.27 |
| | ජේ.ආර්.සී. ජයතිලක මහතා | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 2018.07.02<br>2018.07.04 |
| | | මැලේසියාව | පුහුණු වැඩසටහන් | 2018.09.17<br>2018.09.23 |
| | | බංගලාදේශය | නියෝජිත මණ්ඩල සමුළු | 2018.11.18<br>2018.11.19 |
| | | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 2018.12.18<br>2018.12.20 |
| සහකාර අධ්‍යක්ෂ | ජී.ඩී.එස්.පී. කුමාර මහතා | ස්වීඩනය | පුහුණු වැඩසටහන් | 2018.01.21<br>2018.02.16 |
| | ආර්.එල්. වීරසේකර මහතා | ඉන්දියාව | නියෝජිත මණ්ඩල සමුළු | 2018.08.01<br>2018.08.19 |
| | එච්.ජී.එන්. ආසිරි මහතා | චීනය | පුහුණු වැඩසටහන් | 2018.10.08<br>2018.10.28 |
| ගණකාධිකාරී | එස්.ජී.එම්.ඒ.පී. සේනාරත්න මෙය | චීනය | පුහුණු වැඩසටහන් | 2018.10.08<br>2018.10.28 |
| සංවර්ධන නිලධාරී | කේ.ඩී.ජේ. වසන්ත මහතා | ඉන්දියාව | පුහුණු වැඩසටහන් | 2018.07.09<br>2018.07.20 |
| | බී.එම්.ජේ. බණ්ඩාර මහතා | චීනය | පුහුණු වැඩසටහන් | 2018.05.23<br>2018.06.12 |
| | කේ.එම්.ජී.ඒ. කස්තුරි මෙය | චීනය | පුහුණු වැඩසටහන් | 2018.05.23<br>2018.06.12 |

*මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018*

වගුව 3.5 2018 වර්ෂයේදී දේශීය පුහුණු පාඨමාලා /අධ්‍යයන චාරිකා/සම්මන්ත්‍රණ සඳහා සහභාගි වූ නිලධාරින්

| තනතුර | නම | පාඨමාලාව | කාලය |
|---|---|---|---|
| අධ්‍යක්ෂ ජනරාල් | සී. ජයසූරිය මහතා | Speechcraft Training with the Toasmaster s International for Special Grade Officefs of All Island Service | 2018.03.26 දින සිට දින 10ක් |
| අධ්‍යක්ෂ | එම්.කේ.පී. කුමාර මහතා | Workshop on Public Debt Management | 2018.07.30 2018.08.10 |
| | | Effective Communication Skills and personality Development through Speechcraft | 2018.10.04 |
| | | Workshop on Bid Evaluation | 2018.10.16 |
| | ජේ.ආර්.සී. ජයතිලක මහතා | Video-Based Training Course on Trade Remedies – Substance and Procedures | 2018.05.14 දින සිට දින 10ක් |
| | | Capacity Building program for the Official of Sri Lanka Administrative Service Class - I - Strategic Leadership Module | 2018.08.14 2018.08.17 |
| | | Workshop on Bid Evaluation | 2018.10.16 |
| සහකාර අධ්‍යක්ෂ | එම්.ඒ.සී.එන්. සෙනෙවිරත්න මිය | Capacity Building programme for Officers of the SLAS Class III | 2018.09.14 2018.09.18 |
| | | Workshop on Bid Evaluation | 2018.10.16 |
| | | Commissioning of ITMIS System in Treasury Departments | 2018.11.11 2018.11.14 |
| | එච්.ජී.ටී. ප්‍රසංගිකා මිය | Special Lecture on Framework agreement as a tool for Procurement of medicines examples from EU and western contries | 2018.01.05 |
| | | Speechcraft Training with Toastmasters International for SLAS Class III Officers | 2018.06.08 2018.06.09 |
| | ජී.ඩී.එස්.පී. කුමාර මහතා | Video-Based Training Course on Trade Remedies – Substance and Procedures | 2018.05.14 දින සිට දින 10ක් |
| | | Follow-up Seminar on Sida International training programme Quality Infrastructure Development in Support of World Trade | 2018.09.16 2018.09.21 |
| | ආර්.එල්. වීරසේකර මහතා | Special Lecture on Framework agreement as a tool for Procurement of medicines examples from EU and western contries | 2018.01.05 |

| | | | |
|---|---|---|---|
| | | Seminar on Implementation of Paperless Procedures by Sri Lanka Customs | 2018.02.15 |
| | | Workshop on Bid Evaluation | 2018.10.16 |
| | ඩී.ටී. සුතර්ශන් මිය | Special Lecture on Framework agreement as a tool for Procurement of medicines examples from EU and western contries | 2018.01.05 |
| ගණකාධිකාරී | එස්.ජී.එම්.පී. සේනාරත්න මෙය | Session on Strategies for Improving Workforce Productivity in the Public Sector | 2018.06.07 |
| | | Diploma in Public Procurement Contract Agreement (DIPPCA) | 2018.11.24 සිට වසර 01ක් |
| | | Commissioning of ITMIS System in Treasury Departments | 2018.11.11 2018.11.14 |
| පරිපාලන නිලධාරී | ඊ.ඒ.පී.පී. චන්දන මහතා | සිංහල භාෂාවෙන් රාජකාරි ලිපි සම්පාදනය සම්බන්ධව රාජ්‍ය ආයතනවල නිලධරයන් දැනුවත් කිරිම | 2018.11.27 |
| සංවර්ධන නිලධාරී | කේ.එම්.ජී.ඒ. කස්තුරි මෙය | Workshop on Public Private Partnership | 2018.02.15 2018.02.16 |
| | | Symposium on cerating university -Industry link | 2018.03.12 |
| | එම්. නන්දනී මෙය | Diploma in English for Junior Executives (DEJE) -level 3 | 2018.11.15 සිට සති 12 |
| | ජේ.ඒ.ඩී.යු. රණසිංහ මිය | Business Culture Exchange and Integration for Sri Lanka | 2018.07.31 2018.08.25 |
| | එස්.එම්. මහගෙදර මිය | Project management & Proposal Writing | 2018.01.29 2018.01.30 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර | ඒ. දිසානායක මිය | Diploma in English for Junior Executives (DEJE) -level 2 | 2018.04.26 2018.07.26 |
| | එම්.එන්. දිල්රුක්ෂි මිය | Slida Certificate Course in English for Employment Purpose(CEEP) 1st Intake | 2018.06.24 සිට සති 12 |
| | | Slida Certificate Course in English for Employment Purpose(CEEP) 2nd Intake -2nd stage | 2018.12.30 සිට |
| | ඩබ්.එස්.පී.පෙරේරා මිය | Course for Exemption from Efficiency Bar Examination of Grade I Public Management Assistants Service (Batch I) | 2018.09.03 2018.09.14 (දින 10ක්) |
| | | සිංහල භාෂාවෙන් රාජකාරි ලිපි සම්පාදනය සම්බන්ධව රාජ්‍ය ආයතනවල නිලධරයන් දැනුවත් කිරිම | 2018.11.27 |
| | එම්.කිරුෂා | Course for Exemption from | 2018.09.03 |

| | | | |
|---|---|---|---|
| | | Efficiency Bar Examination of Grade I Public Management Assistants Service (Batch I) | 2018.09.14 (දින 10ක්) |
| | ජී.කේ.සී.කේ. ප්‍රියදර්ශනී මිය | Course for Exemption from Efficiency Bar Examination of Grade I Public Management Assistants Service (Batch I) | 2018.09.03 2018.09.14 (දින 10ක්) |
| | ඩබ්.ආර්.එන්. ප්‍රනාන්දු මිය | Course for Exemption from Efficiency Bar Examination of Grade I Public Management Assistants Service (Batch I) | 2018.09.03 2018.09.14 (දින 10ක්) |
| | එල්.ඒ.එස්. විජේබණ්ඩාර මිය | Certificate in English for employment purposes (CEEP) | 2018.02.06 දින සිට සති 12 ක් (අඟහරුවාදා) |
| | ඩබ්.ආර්.ආර්. වික්‍රමසිංහ මෙය | Diploma in English for Junior Executives (DEJE) -level 2 | 2018.04.26 2018.07.26 |
| | | Budget progress Moinitoring System(BPMS) | 2018.05.28 |
| | | Diploma in English for Junior Executives (DEJE) -level 3 | 2018.11.15 සිට සති 12ක් |
| | ඒ.ඒ.ඩී.ඩී.ජී. අතපත්තු මහතා | File management & General Officer Administration E-code | 2018.10.31 2018.11.02 |
| | | Commissioning of ITMIS System in Treasury Departments | 2018.11.11 2018.11.14 |
| | එස්.ජී. නිලාන්ති මිය | Course for Exemption from Efficiency Bar Examination of Grade I Public Management Assistants Service (Batch I) | 2018.09.03 2018.09.14 |
| | එස්.එස්. රණවීර මහතා | Commissioning of ITMIS System in Treasury Departments | 2018.11.11 2018.11.14 |
| රියදුරු | ආර්.ඒ.ඩී.සී. ප්‍රියදර්ශන මහතා | රාජ්‍ය සේවකයන් සඳහා දෙමළ භාෂාව පිලිබඳ දින 6 ක පුහුණුව | 2018.06.13 2018.06.21 |
| කාර්යාල කාර්ය සහායක | ඒ.කේ.පී.ආර්. උබේසේකර මහතා | රාජ්‍ය සේවකයන් සඳහා දෙමළ භාෂාව පිලිබඳ දින 6 ක පුහුණුව | 2018.06.13 2018.06.21 |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018***

## 3.2 මූල්‍ය අංශය

දෙපාර්තමේන්තුව සඳහා ප්‍රතිපාදන වලින් පුනරාවර්තන වියදම් සඳහා රු. 290,450,000 ක් ද ප්‍රාග්ධන වියදම් සඳහා රු1,430,000 ක ප්‍රතිපාදන ද ඇතුළුව රු. 291,880,000 ප්‍රතිපාදන මුදලක් 2018 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 244 වැඩ සටහන 01 හා ව්‍යාපෘතිය 01 යටතේ වෙන්කර තිබුණි. වසර තුළ මුළු සත්‍ය වියදම් රු. 287,345,234 ක් වූ අතර සත්‍ය පුනරාවර්තන වියදම හා ප්‍රාග්ධන වියදම පිළිවෙලින් රු. 286,098,284 ක් හා රු 1,246,950 ක් විය. වර්ෂය තුළ සත්‍ය වියදම හා රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ විස්තර පහත වගු අංක 3.6 සහ 3.7 මගින් දක්වා ඇත.

**වගුව 3.6 - 2018 වර්ෂය තුළ අයවැය ඇස්තමේන්තු උපයෝජනය**

| වැය ශීර්ෂ විස්තරය | 2018 අයවැය (රු.) | 2018 සත්‍ය වියදම (රු.) | වියදමෙහි ප්‍රතිශතය |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම්** | **290,450,000** | **286,098,284** | **98.5** |
| පුද්ගල පඩිනඩි | 34,390,000 | 31,762,116 | 92.4 |
| ගමන් වියදම් | 4,859,365 | 3,818,443 | 78.6 |
| සැපයීම් | 3,035,000 | 2,926,355 | 96.4 |
| නඩත්තුවියදම් | 1,750,000 | 1,563,322 | 89.3 |
| සේවා | 7,135,768 | 6,772,020 | 94.9 |
| මාරුකිරීම් | 239,279,867 | 239,256,027 | 100.0 |
| **ප්‍රාග්ධන වියදම්** | **1,430,000** | **1,246,950** | **87.2** |
| ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම | 50,000 | 0 | 0 |
| ප්‍රාග්ධන වත්කම් අත්පත්කර ගැනීම | 880,000 | 806,750 | 91.7 |
| හැකියා වර්ධනය | 500,000 | 440,200 | 88.0 |
| **මුළු එකතුව** | **291,880,000** | **287,345,234** | **98.4** |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018***

පහත 3.7 වගුවෙන් පෙන්වා ඇති පරිදි වර්ෂය තුළ පාර්ලිමේන්තුවෙන් අනුමත කරන ලද සීමාවන් තුළ රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුම පවත්වාගෙන යන ලදී.

**වගුව 3.7 - රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම 2018**

| විස්තරය | අනුමත සීමාව (රු.) | සත්‍ය වියදම (රු) |
|---|---|---|
| වියදමේ උපරිම සීමාව | 4,000,000 | 3,465,773 |
| ලැබීම් වල අවම සීමාව | 1,500,000 | 2,309,183 |
| හර ශේෂයේ උපරිම සීමාව | 12,000,000 | 9,636,240 |

***මූලාශ්‍රය : වෙළඳ හා ආයෝජන ප්‍රතිපත්ති දෙපාර්තමේන්තුව, 2018***

### 3.3 විගණන විමසුම්

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් හා අභ්‍යන්තර විගණන අංශයෙන් ඉදිරිපත් කරන ලද සියලුම විගණන විමසුම් සඳහා පිළිතුරු ලබා ඇති අතර දුර්වලතා නිවැරදි කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගෙන තිබේ.